ටේ ශක්ති අරමුදල

தேயிலை சக்தி நிதியம

TEA SHAKTHI FUND

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2016

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

MINISTRY OF PLANTATION INDUSTRIES

තේ ශක්ති අරමුදල

"ඉර සේවය මෙන් සැමදා සේවයට"

වාර්ෂික වාර්තාව - 2016

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පටුන

	පිටුව
1. හැඳින්වීම	2-3
2. දැක්ම, මෙහෙවර සහ තේ ශක්ති අරමුදලේ පරමාර්ථ	4
3. ලේකම්තුමාගේ පණිවිඩය	5-6
4. මූල්‍ය විශ්ලේෂණය	7
5. සංස්ථාපිත තොරතුරු	8
6. අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන් සහ විධායක කාර්යය මණ්ඩලය	9-10
7. ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය	11-14
8. තේ ශක්ති ව්‍යාපෘති	15
9. මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචනය කිරීම	16-20
10. ආදායම් විස්තරය	21
11. ශේෂ පත්‍රය	22
12. ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය	23
13. මුදල් ප්‍රවාහ ප්‍රකාශ	24
14. ගිණුම්කරණ ප්‍රතිපත්ති	25-38
15. ගිණුම්කරණ සටහන්	39-45
16. විගණකාධිපති වාර්තාව - 2016	

හැඳින්වීම

තේ ශක්ති අරමුදල කුඩා තේ වතු හිමියන්ගේ සුභ සාධනය හා ආර්ථික තත්ත්වය ඉහළ තලයකට ගෙන ඒමේ අරමුණින් 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත යටතේ තේ ශක්ති අරමුදල ස්ථාපනය කරන ලදී. කුඩා තේ වතු හිමියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් සමාජ ආරක්ෂණ ක්‍රමයක්, ගොවි විශ්‍රාම වැටුපක් සහ ට්‍රැක්ටර් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ඉන්පසුව කුඩා තේ වතු හිමියන් වෙත ඉහළ තත්ත්වයෙන් යුතු පොහොර ලබාදීමේ අරමුණින් පොහොර ව්‍යාපෘතියක් ද ස්ථාපනය කරන ලදී.

තේ ශක්ති අරමුදල ආරම්භ කිරීම සඳහා රජයේ දායකත්වය ලෙස රුපියල් මිලියන 437.5 ක් ද තේ ශක්ති සාමාජිකයන් 94,425කගේ කොටස් මුදල් වශයෙන් රුපියල් මිලියන 208.9ක් සහ තේ ශක්ති සාමාජික මුදල් රුපියල් මිලියන 133 යොදවන ලදී. ඉන්පසු මෙම ආයෝජනයෙන් තේ ශක්ති කම්හල් ව්‍යාපෘතිය, තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය, දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ආරම්භයේ සිට තේ ශක්ති අරමුදල ලාභදායි තත්ත්වයෙන් පවත්වා ගෙන ගිය නමුත් ඉන්පසු තේ ශක්ති අරමුදලේ ඇති වූ කාරක ප්‍රාග්ධන අර්බුදය හේතුවෙන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016ට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල බලතල අත්හිටුවා එහි බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරන ලදී. එසේම එම අමාත්‍ය මණ්ඩල තීරණය මත තේ ශක්ති අරමුදල යටතේ පැවති කර්මාන්තශාලා 12 ක් ද මාවරල වත්ත සහ හොරණ අරමණාගොල්ලේ පිහිටි පොහොර ගබඩා සංකීර්ණය බදු පදනම මත හෝ කළමනාකරණය පැවරීමේ පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීමට කටයුතු කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු කම්හල්වලින් බදු වාරික මුදල් සහ කළමනාකරණ ගාස්තු තේ ශක්ති අරමුදල වෙත ලැබෙන අතර, ඉදිරියේදී කෙටි කාලීන වගකීම් සහ රුපියල් මිලියන 135 ක සුභසාධන රක්ෂණ අරමුදල ගොඩනැගීමෙන් පසු ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට 2016 ජූලි මස 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 38/2016 සඳහා 2016.08.17 දාතමින් ලැබුණ අමප/16/1427/726/015 II අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇත.

තේ ශක්ති අරමුදලේ කාර්යයන් මේ වනවිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි. ඒ සඳහා තේ ශක්ති අරමුදලේ සේවය කළ සීමිත කාර්ය මණ්ඩලයක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර වෙනම අංශයක් ලෙස ස්ථාපිත කර ඇත.

උක්ත 2016 ජූලි මස 21 දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ සේවය කරන ලද සේවකයින්ගෙන් කොටසකගේ සේවය අවසන් කර වන්දි හා පාරිතෝෂික දීමනා ලබා දී ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 124ක් මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇත. ඒ යටතේ ප්‍රධාන කාර්යාලයේ සේවකයින් 19, කම්හල් කාර්ය මණ්ඩලයේ සේවකයින් 67ක ගේ සේවය අවසන් කර තේ ශක්ති කම්හල්වල සේවය කළ කම්කරුවන් 374ක ගේ සේවය නව බදු / කළමනාකරණ ගැණුම්කරු යටතේ අඛණ්ඩව ලබාදීමට බදු / කළමනාකරණ ගිවිසුම් මඟින් එකඟතාවය ලබාදී ඇත. එසේම 2016.12.31 දිනට අඛණ්ඩව වසර 05ක සේවා කාලය සම්පූර්ණ කරන ලද කම්හල් කම්කරුවන් සඳහා අදාල සේවා කාලයට හිමි පාරිතෝෂික මුදල් ඔවුන් වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ සේවකයන් අතරින් සේවකයින් පස්දෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත නිලධාරීන් හතරදෙනෙක් ද පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත එක් නිලධාරියකු ද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නිලධාරීන් පස්දෙනෙක් සහ තේ ශක්ති අරමුදල සඳහා හත්දෙනෙක් ලෙස අනුයුක්ත කරන ලදී.

එසේම තේ ශක්ති අරමුදලේ සේවකයින් වෙත වැටුප් ගෙවීම හා තේ ශක්ති කර්මාන්තශාලා මඟින් තැරුවිකරුවන්ගෙන් ලබාගෙන ඇති ණය, මිලදී ගත් අමු දළු සඳහා ගෙවීම් ආදී සියළු කෙටිකාලීන වගකීම් නිරවුල් කිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, ඒ සඳහා මහභාණ්ඩාගාරයෙන් රු. මි. 167.87ක මුදලක් ලබා දී ඇත.

දැක්ම

කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ඨම ආයතනය බවට පත් වීම

මෙහෙවර

තේ ශක්ති අරමුදලේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාර්යක්‍ෂම හා සඵලදායීව තේ ශක්ති අරමුදල කළමනාකරණය කිරීම

තේ ශක්ති අරමුදලේ පරමාර්ථ

- කුඩා තේ වතු හිමියන්ගේ සිත් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ධාරණය කරවීම හා ඔවුන්ගේ ආර්ථික හා සාමාජයීය තත්ත්වය උසස් කරලීම.
- තේ කර්මාන්තයට අදාළව අවශ්‍යවන්නා වූ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- තේ කර්මාන්තශාලා අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම හා කුඩා තේ වතු හිමියන්ගේ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් ලබා දීම.
- එම තේ කර්මාන්තශාලාවල නිෂ්පාදනයන් අලෙවි කිරීමේ කාර්යයන් වැඩි දියුණු කර සංවර්ධනය කිරීම.
- කුඩා තේ වතු හිමියන් වශයෙන් තේ නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින අයගේ සුභ සාධනය සඳහා අවශ්‍යවන්නා වූ කටයුතු සිදු කිරීම.
- වැවිලි කර්මාන්තය සඳහා අවශ්‍ය වන පොහොර ආනයනය කිරීම, නිෂ්පාදනය හා අලෙවි කිරීම.
- ශක්ති සම්පන්න ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස පවත්වා ගෙන යාම.
- සාධ්‍ය වූ ලාභ උපදවන ස්ථිතියක් බවට පත් වීම සහ 10% ක ශුද්ධ ලාභ ප්‍රමාණයක් පවත්වා ගැනීම.
- 25% තිරසාර වර්ධනයක් අත්කර ගැනීම.
- අවදානම් හඳුනා ගැනීම සහ විධිමත් ලෙස කළමනාකරණය.

ලේකම්තුමාගේ පණිවිඩය

තේ ශක්ති අරමුදල 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත යටතේ පිහිටුවා ඇති අතර, 2016 වර්ෂයේදී ඇති වූ උග්‍ර කාරක ප්‍රාග්ධන අර්බුදය හේතුවෙන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල බලතල අත්හිටුවා එකී බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරන ලදී.

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු එහි කාර්යයන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබන අතර, ඒ සඳහා තේ ශක්ති අරමුදලේ සේවය කළ සීමිත කාර්යය මණ්ඩලයක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට තේ ශක්ති අරමුදල පවරා ගන්නා අවස්ථාවේදී තේ ශක්ති අරමුදල විසින් ගෙවිය යුතු රුපියල් මිලියන 167ක පමණ කෙටිකාලීන වගකීම් පැවති අතර, එම වගකීම් අතර, කර්මාන්තශාලා වෙත දළු මිලදී ගැනීම වෙනුවෙන් දළු හිමියන් වෙත ගෙවිය යුතු හිඟ අත්තිකාරම් මුදල්, හිඟ විදුලි බිල්පත්, කර්මාන්තශාලාවල සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු හිඟ මුදල්, හිඟ කම්කරු වැටුප්, හිඟ කාර්ය මණ්ඩල වැටුප්, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් හා හිඟ පාරිතෝෂික මුදල් විය. ඒ අනුව, අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය පරිදි අදාල හිඟ මුදල් මහාභාණ්ඩාගාරයෙන් ලබාගෙන එකී වගකීම් නිරවුල් කිරීමට කටයුතු කරන ලදී.

එසේම 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016ට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදල යටතේ පැවති කර්මාන්තශාලා 12 ක් මාවරල වත්ත සහ හොරණ අරමණාගොල්ලේ පිහිටි පොහොර ගබඩා සංකීර්ණය බද්ද පදනම මත හෝ කළමනාකරණය පැවරීමේ පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීම සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර දෙනියාය, ගිලීමලේ සහ දැරණියගල තේ ශක්ති කම්හල් 2016 වර්ෂයේදී බාහිර පාර්ශවයන් වෙත බද්ද / කළමනාකරණය පැවරීමට කටයුතු කරන ලදී.

විධිමත් වතු අංශය අභිබවා සීඝ්‍රයෙන් තේ ක්ෂේත්‍රයෙහි සිය අනන්‍යතාවය තහවුරු කර ගත් කුඩා තේ වතු හිමියන් රටේ දරිද්‍රතාවය අඩු කිරීමට හා ජාතික ආර්ථිකයට ඇති දායකත්වය වටහා ගැනීමෙන්

ඔවුන් සංවිධානාත්මක තලයකට ගෙන ඒම අරමුණු කර ගත් තේ ශක්ති අරමුදල් සංකල්පය කොතරම් කාලීන හා අර්ථසම්පන්න වැඩ පිළිවෙලක් වුවත් පසුකාලීනව එහි කළමනාකාරීත්වයෙහි පැවති අඩුපාඩු නිසා අපේක්ෂිත අරමුණු කරා ළඟා නොවූ බැවින්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සුදුසු පරිදි කළමනාකරණ තීරණ ගැනීමට කටයුතු කරන ලදී.

බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

මූල්‍ය විශ්ලේෂණය

2016 දෙසැම්බර් 31 දින දක්වා

මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශ

	2014	2015	2016
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
ආදායම	621.59	573.52	100.63
විකුණුම් පිරිවැය	(611.32)	(552.52)	(147.06)
දළ ලාභය	10.27	21.00	(46.42)
වෙනත් ආදායම්	44.08	43.84	152.34
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	(15.51)	(14.93)	00
ආයතන හා පරිපාලන වියදම්	(200.33)	(188.38)	(178.44)
රාජ්‍ය පරිත්‍යාග කපා හැරීම්	43.75	119.30	43.75
ශුද්ධ මූල්‍ය වියදම්	(10.08)	(20.07)	(1.75)
ශුද්ධ ලාභය / අලාභය	(127.82)	(39.23)	(30.53)
ලාභාංශ	නැත	නැත	නැත
මුළු වත්කම්	758.47	696.79	643.64
කාරක ප්‍රාග්ධනය	63.39	19.11	(1.08)
ජංගම ප්‍රාග්ධනය	1:1.9	1:0.98	1:0:.98

2014, 2015 සහ 2016 ශේෂයන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව ගැලපීම් කිරීමෙන් පසු ඉදිරිපත් කර ඇත.

සංස්ථාපිත තොරතුරු

නම : තේ ශක්ති අරමුදල

ලිපිනය : 553 A, මාදිවෙල පාර, තලවතුගොඩ
(2016 පෙබරවාරි මස 15 වන දින දක්වා)

දු. ක. : 011-7421121

ෆැක්ස් : 011-22796537, 011-7421122

ලිපිනය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල (2016 සැප්තැම්බර් දක්වා)

දු. ක. : 011-7909020

ෆැක්ස් : 011-2784925

ලිපිනය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, තේ ශක්ති අරමුදල, 10වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල

දු. ක. : 011-2186207

ෆැක්ස් : 011-2186202

E-mail : tsf@teashakthi.gov.lk

සංස්ථාපන කිරීමේ පනත : 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත

සංස්ථාපනය කිරීමේ වර්ෂය : 2000

ව්‍යාපාර ස්වභාවය

* තේ කොමසාරිස් රෙගුලාසි යටතේ තේ දළු මිලදී ගැනීමේ පදනම මත කුඩා තේ වතු හිමියන්ගෙන් අමු තේ දළු මිලදී ගෙන නිෂ්පාදනය කිරීමේ සහ නීත්‍යානුකූලව බලයලත් මාර්ග ඔස්සේ තේ විකිණීම.

* තේ වගාකරුවන්ට විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ට ඉතා සුළු ලාභයක් තබා ගෙන නිර්දේශිත සූත්‍රයක් අනුව පොහොර ද්‍රව්‍ය මිශ්‍ර කර විකිණීම.

* පාරිභෝගිකයන් වෙනුවෙන් දේශීය වෙළඳපොලේ තේ මිශ්‍රණ බෙදා හැරීම.

විගණකවරු : රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරු : ලංකා බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් සහ විධායක කාර්යය මණ්ඩලය

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

1. විජේරත්න දෙවගෙදර මහතා - අධ්‍යක්ෂ/සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
2. දයා අවිරුප්පොල මහතා - ප්‍රධාන විධායක නිලධාරී (2016 පෙබරවාරි 02 දක්වා)
3. නෙවිල් රත්නායක මහතා - ප්‍රධාන විධායක නිලධාරී (2016 පෙබරවාරි 02 දිනෙන් පසු)
4. ඩී.පී.විමලසේන මහතා - ප්‍රධාන ගණකාධිකාරී/භාණ්ඩාගාර අධ්‍යක්ෂ
5. එස්.ආර්.එස්. ද සිල්වා මහතා - සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
6. ඒ.ඩබ්.එච්.අයි.සී. වීරකෝන් මහතා - අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
7. එම්.බී. සිරිල් මහතා - අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
8. නෙවිල් රත්නායක මහතා - අධ්‍යක්ෂ/සභාපති, සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය/ ප්‍රධාන විධායක නිලධාරී, තේ ශක්ති අරමුදල
9. ජේ. එම්. බී. ජේ. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ/සභාපති, රත්නපුර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
10. ඩබ්. ආර්. එස්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, නුවරඑළිය කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
11. ආර්. එම්. ගුණසේකර මහතා - අධ්‍යක්ෂ /සභාපති, බදුල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
12. බී. ජී. අබේසිංහ මහතා - අධ්‍යක්ෂ/සභාපති, මහනුවර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
13. පී. එච්. සුසන්ත ද සිල්වා මහතා - අධ්‍යක්ෂ/සභාපති, ගාල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
14. කේ. එල්. ගුණරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, කළුතර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
15. පී. ආර්. ඒ. රත්නායක මහතා - අධ්‍යක්ෂ/සභාපති, කෑගල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය

මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2016.07.07 වන දින වනතුරු ක්‍රියාත්මක විය. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016ට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර එහි බලය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරුනි.

විගණන සහ කළමනාකරණ කමිටුව

1. එම්. එස්. එච්. මොහොට්ටි මහතා - සභාපති, විගණන සහ කළමනාකරණ කමිටුව
2. ආර්. යූ. පී. ආර්. සිරිවර්ධන මහතා - කැඳවුම්කරු, විගණන සහ කළමනාකරණ කමිටුව
3. ඒ.එම්. පී. එම්. බී. අතපත්තු මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
4. නෙවිල් රත්නායක මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
5. ජේ. එම්.බී. ජේ. බණ්ඩාර මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව
6. ඊ. ඒ. පී. ආනන්ද මහතා - සාමාජික, විගණන සහ කළමනාකරණ කමිටුව

විධායක නිලධාරීන්

1. දයා අවිරුප්පොල මහතා - ප්‍රධාන විධායක නිලධාරී 2016 පෙබරවාරි මාසය දක්වා
2. නෙවිල් රත්නායක මහතා - ප්‍රධාන විධායක නිලධාරී (2016 පෙබරවාරි මස සිට 2016 දෙසැම්බර් 31 දක්වා)
3. පී. ජී. ආර්. තිස්ස මහතා - ප්‍රධාන ගණකාධිකාරී
4. එම්. එස්. එච්. මොහොට්ටි මහතා - අභ්‍යන්තර විගණක
5. ආර්. යූ. පී. ආර්. සිර්වර්ධන මහතා - කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන)
6. නිහාල් වීරසේකර මහතා - කළමනාකරු (පොහොර සහ දේශීය තේ අලෙවි)
7. ඩබ්.ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා - ගණකාධිකාරී
8. චමිල ජයවික්‍රම මහතා - අභ්‍යන්තර විගණන නිලධාරී
9. ඒ. එච්. සී. කේ. කරුණාරත්න මහතා - පරිගණක පද්ධති පරිපාලක
10. එම්. ඒ. ඉන්දිකරත්න මහතා - සුභසාධන නිලධාරී

ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

තේ ශක්ති අරමුදලේ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2016 ජුනි මස 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016ට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරන ලදී.

<u>මූලික ක්‍රියාකාරකම්</u>

පහත දක්වා ඇති ව්‍යාපෘති තේ ශක්ති අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද අතර, එම ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය පිළිබඳව පිළිවෙලින් පිටු අංක 16, 17, 18 හා 19 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

1. කම්හල් ව්‍යාපෘතිය
2. පොහොර ව්‍යාපෘතිය
3. දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය
4. තේ ශක්ති සමාජ සහ සුභසාධන ආරක්ෂණ ක්‍රමය

<u>මෙහෙයුම් ආදායම</u>

සමාලෝචිත වර්ෂයේදී කම්හල් ව්‍යාපෘතිය, දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය සහ පොහොර ව්‍යාපෘතිය අලාභ ලබන තත්ත්වයට පත් වී ඇත. මේ පිළිබඳව අවසන් ගිණුම් වාර්තාවේ පෙන්වා ඇති අතර, ඉහත ව්‍යාපෘතිවලින් 1,2 සහ 3 ලෙස සඳහන් කරන ලද ව්‍යාපෘති 2016 ජූලි මාසයෙන් පසු ක්‍රියාත්මක නොවේ.

ලාභ හා විසර්ජනයන්

2015 සහ 2016 සඳහා පිරිවැටුමේ සහ මෙහෙයුම් ලාභවල තොරතුරු පහත දැක්වේ.

	2016 (රුපියල්)	2015 ^රුපියල්)
තැරැව්කාර විකුණුම්වලින් ලද ආදායම	95,469,667	525,348,607.00
දේශීය තේ විකුණුම්	2,870,003	28,146,840.00
පොහොර විකුණුම්	573,000	14,872,520.00
අමු ද්‍රව්‍ය ආදායම	-	2,357.00
කසල තේ ආදායම	1,727,187	5,426,424.00
විකුණුම් වට්ටම	-	(277,485.00)
මුළු ආදායම	**100,639,857.00**	**573,519,262.00**
විකුණුම් පිරිවැය	(147,060,681.00)	(552,517,570.00)
දළ ලාභය	**(46,420,824.00)**	**21,001,692.00**
වෙනත් ආදායම්	152,340,999.00	43,844,841.00
පරිපාලන වියදම්	(178,445,015.00)	(188,377,711.00)
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	-	(14,928,507.00)
මුළු මෙහෙයුම් ලාභය	(72,524,840.00)	(138,459,686.00)
මූල්‍ය පිරිවැය	(1,755,101.00)	(20,073,109.00)
රාජ්‍ය පරිත්‍යාග ලියා හැරීම	43,750,503	119,300,503
බදුවලට පෙර මෙහෙයුම් ලාභය	**(30,529,438.00)**	**(39,232,291.00)**
ආදායම් බදු	-	-
ශුද්ධ ලාභය/අලාභය	**(30,529,438.00)**	**(39,232,291.00)**

ලාභාංශ සහ සංචිත

සමාලෝචිත වර්ෂය තුළ ලාභාංශ ගෙවීම සඳහා ලාභයක් නොමැති බැවින්, ලාභාංශ ගෙවීම සිදු කර නැත.

සංස්ථාපිත ආධාර

2016 වර්ෂය තුළ රු. 150,000,000.00 ක මුදලක් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස ලැබී ඇත.

ප්‍රාග්ධන වියදම්

තේ ශක්ති අරමුදලෙහි දේපළ, යන්ත්‍ර සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 20 මඟින් දක්වා ඇත.

<u>දායකත්ව ප්‍රාග්ධනය</u>

රජයේ දීමනා	රු.	**150,000,000.00**
කොටස් ප්‍රාග්ධනය	රු.	**206,014,150.00**

<u>බදු ගිවිසුම්</u>

2016 වර්ෂයේදී පහත දක්වා ඇති කම්හල් බදු/කළමනාකරණ ගැණුම්කරුවන් වෙත පැවරීමට අදාලව ගිවිසුම් අත්සන් කරන ලදී.

- රයිගම්කෝරලේ තේ ශක්ති කම්හල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2016.06.10 දින දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත බදු පදනම මත ලබාදී ඇත.

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2016 ජුනි මස 21 දාතමින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016ට ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කම්හල් බදු දීමට යෝජනා කැඳවා බදු හා කළමනාකරණ ගැණුම්කරුවන් තෝරා ගෙන බදු හා කළමනාකරණය පවරා දීමට කටයුතු කරන ලදී.

- දැරණියගල කම්හල - 2016.12.28 දින රත්නපුර ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) සමාගම වෙත බදු පදනම වෙත පවරා ඇත.
- ගිලීමලේ කම්හල - 2016.11.24 දින කේ.ඩී. අසංකා ප්‍රියදර්ශණී කුරුප්පු වෙත බදු පදනම මත පවරා ඇත.
- දෙනියාය කම්හල - 2016.11.17 වන දින අජිත් ලසන්ත ගුණවර්ධන වෙත බදු පදනම මත පවරා ඇත.

<u>අදාළ නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් අනුකූලතාවය</u>

මූල්‍ය ප්‍රකාශයන්හි අන්තර්ගත කළ යුතු වන්නා වූ ද්‍රව්‍යාත්මක මුදල් ගැලපීම්වලට මං පාදන හෝ තේ ශක්ති අරමුදලෙහි හෝ එහි බල සීමාවෙහි නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන කිසිදු ක්‍රියාකාරකමක් හෝ එවැනි තත්ත්වයක් සිදුව නොමැති බව අපගේ උපරිම විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරමු.

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පිටු අංක 9 හි දක්වා තිබේ. තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල 2016 ජූලි මස 07 වන දින තෙක් ක්‍රියාත්මක වූ අතර, 2016 ජූනි මස 21 වන දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද තීරණය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර එහි බලය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත පවරන ලදී.

කොන්ත්‍රාත් සහ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාව

කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඍජුව හෝ වක්‍රව 2016 ජූලි මස 07 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල බලතල විසුරුවා හරින තෙක් කාලය තුල කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කිසිදු බැඳියාවක් නොදක්වයි.

අධ්‍යක්ෂවරු විසින් ඔවුන් වෙත යම් සබඳතාවක් හෝ විශේෂයක් සහිත කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සිදුවන අවස්ථාවන්හිදී එකී කටයුත්තට පෙර තම සබඳතාව හෝ විශේෂත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් අධ්‍යක්ෂවරු වෙත දැන්වීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය වගබලා ගනී.

පරිසර ආරක්ෂාව

තේ ශක්ති අරමුදලේ සියළු ව්‍යාපාර ක්‍රියාකාරකම් කුමන හෝ ආකාරයකින් පරිසරයට බලපෑමක් නොකරයි. තේ ශක්ති අරමුදලේ ප්‍රතිපත්තිය වන්නේ, පරිසරයට සිදුවන හානිය අවම මට්ටමක පවත්වා ගැනීමත් අදාළ අධිකාරින් සමඟ සබඳතා ප්‍රවර්ධනය කර ගැනීම සහ අදාළ රෙගුලාසිවලට අනුව කටයුතු කිරීමත්ය.

ශේෂ පත්‍රයට පසු කටයුතු

ශේෂ පත්‍රය සකස් කරන දිනට සිදු වෙමින් පැවති සිද්ධි නොවූ අතර, එම නිසා නැවත සකස් කිරීමක් හෝ මූල්‍ය ප්‍රකාශයේ පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවුණි.

අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

තේ ශක්ති අරමුදල දැකිය හැකි අනාගතයක් දක්වා පවතී යන උපකල්පනය මත මූල්‍ය වාර්තාව පිළියෙල කර ඇති අතර, මෙම සංකල්පය යොදා ගනිමින් වත්කම් සහ වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරමින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත.

සියළු පාර්ශ්වකරුවන්ට සියළු ප්‍රකාශ සඳහා සර්වසාධාරණ සැළකීම

අපගේ පාර්ශ්වකරුවන්ගේ අනුග්‍රහය අගය කරන අතරම සියළුම පාර්ශ්වකරුවන්ට සර්වසාධාරණ සැලකිල්ලක් ලබා දීමට තේ ශක්ති අරමුදල විසින් සියළු උත්සාහයන් ගෙන තිබේ.

විගණන නිලධාරීන්

වර්ෂ 2016 ක් වූ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 කොටසේ ප්‍රතිපාදනවලට අනුව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) කොටස අනුව විගණකාධිපතිගේ උපදෙස් ප්‍රකාරව සිදු කරන ලදී.

තේ ශක්ති ව්‍යාපෘති

8.1. තේ ශක්ති තේ කර්මාන්තශාලා

1. බදුල්ල දිස්ත්‍රික්කය

- පස්සර තේ ශක්ති කම්හල

2. නුවරඑළිය දිස්ත්‍රික්කය

- කැප්පෙටිපොළ තේ ශක්ති කම්හල
- කොත්මලේ තේ ශක්ති කම්හල (මහවැලි සංවර්ධන අධිකාරියෙන් බදු පදනම මත)
- මහවැලි තේ ශක්ති කම්හල

3. කළුතර දිස්ත්‍රික්කය

- රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල

4. ගාල්ල දිස්ත්‍රික්කය

- ඇල්පිටිය තේ ශක්ති කම්හල
- වලහන්දුව තේ ශක්ති කම්හල

5. රත්නපුර දිස්ත්‍රික්කය

- ගිලීමලේ තේ ශක්ති කම්හල
- බලංගොඩ තේ ශක්ති කම්හල
- පොතුපිටිය ඉඩම

6. මාතර දිස්ත්‍රික්කය

- දෙනියාය තේ ශක්ති කම්හල
- මාවරල තේ ශක්ති කම්හල

7. කෑගල්ල දිස්ත්‍රික්කය

- දැරණියගල තේ ශක්ති කම්හල
- බුලත්කොහුපිටිය තේ ශක්ති කම්හල (ඉදි කිරීම අවසන් කර නොමැත)

8. පොහොර සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘති

- පොහොර සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය
- මිශ්‍ර කිරීමේ කර්මාන්තශාලාව අරමණාගොල්ල, හොරණ

මූලාා සහ මෙහෙයුම් සමාලෝචනය කිරීම

තේ ශක්ති කර්මාන්තශාලා ව්‍යාපෘතිය

9.2.1. දළු සැපයුම සහ නිමි තේ නිෂ්පාදන

අමු දළු මිලදී ගැනීම සහ නිමි තේ ප්‍රමාණය (කි. ග්‍රෑ.) 2016

කර්මාන්තශාලා	මිලදී ගත් දළු ප්‍රමාණය	නිෂ්පාදිත නිමි තේ ප්‍රමාණය	වෙනත් කරුණු
බලංගොඩ	වසා දමා ඇත		
දෙනියාය	10,993	2,317	2016 ජනවාරි මස
ඇල්පිටිය	32,223	6,928	2016
කැප්පෙටිපොල	18,962	4,077	2016
කොත්මලේ	නිෂ්පාදන කටයුතු නතර කර ඇත		
මහවැලි	13,541	2,911.5	2016.04/05
මාවරල	නිෂ්පාදන කටයුතු නතර කර ඇත		
පස්සර	14,316	3,078	2016.04/05
රයිගම්කෝරලේ	263,624	52,818.75	2016 ජූනි මස දක්වා
වලහන්දූව	17,939	3,857	2016.02
දැරණියගල	නිෂ්පාදන කටයුතු නතර කර ඇත		

- දැරණියගල කම්හල - 2016.12.28 දින රත්නපුර ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) සමාගම වෙත බදු පදනම වෙත පවරා ඇත.
- ගිලීමලේ කම්හල - 2016.11.24 දින කේ.ඩී. අසංකා ප්‍රියදර්ශණී කුරුප්පු වෙත බදු පදනම මත පවරා ඇත.
- දෙනියාය කම්හල - 2016.11.17 වන දින අජිත් ලසන්ත ගුණවර්ධන වෙත බදු පදනම මත පවරා ඇත.
- රයිගම්කෝරලේ කම්හල - 2016.06.10 දින දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත බදු පදනම මත ලබාදෙන ලදී.

දෙනියාය තේ ශක්ති කම්හලෙහි තේ නිෂ්පාදන කටයුතු 2016 ජනවාරි මසින් පසු සිදු නොකරන ලදී. 2016 වර්ෂයේදී තේ ශක්ති අරමුදලේ කර්මාන්තශාලා මඟින් නිමි තේ කිලෝග්‍රෑම් 75,987 ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත. තේ ශක්ති අරමුදල 2016 වර්ෂයේදී තේ නිෂ්පාදන ආදායම ලෙස රුපියල් මිලියන 95.47ක මුදලක් උපයා ඇත.

තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය

තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය හොරණ, අරමණාගොල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අතර, එහි තේ, රබර් සහ කුරුඳු වැනි භෝග සඳහා අවශ්‍ය වන පොහොර නිෂ්පාදනය හා අලෙවි සිදු කරනු ලැබුනි. නමුත් තේ ශක්ති අරමුදල 2016 වර්ෂයේදී උද්ගත වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් ඇති වූ කාරක ප්‍රාග්ධන හිඟතාවය මත පොහොර නිෂ්පාදනය සිදු කිරීමට අවශ්‍ය මූලික පොහොර මිලදී ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වූ අතර, එම හේතුවෙන් පොහොර ව්‍යාපෘතිය පාඩු ලබන තත්ත්වයට පත්විය.

පොහොර ආදායම - 2015 / 2016

කාණ්ඩය	2015	2016
වටිනාකම (රු.)	14,592,678	573,000

තේ ශක්ති අරමුදල තුල ක්‍රියාත්මක වූ පොහොර ව්‍යාපෘතිය 2016 ජූනි මස 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016 සඳහා ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දාතමින් ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වසා දැමීමට ක්‍රියා කරන ලදී.

තේ ශක්ති දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය

දේශීය තේ අලෙවි ආදායම 2015 සිට 2016 වර්ෂය දක්වා

කාණ්ඩය	2015	2016
දේශීය තේ අලෙවිය (රු)	2,830,159	2,848,418

තේ ශක්ති අරමුදල තුල ක්‍රියාත්මක වූ දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය 2016 ජූනි මස 21 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 37/2016 සඳහා ලද අංක අමප/16/1224/726/015-1 හා 2016.07.05 දාතමින් ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වසා දැමීමට ක්‍රියා කරන ලදී.

තේ ශක්ති සමාජ සහ සුභසාධන ආරක්ෂණ ක්‍රමය

මෙම සුභසාධන රක්‍ෂණ අරමුදල කුඩා තේ වතු හිමියන් සඳහා ඇති එකම සුභසාධන ව්‍යාපෘතිය වේ. එක් සාමාජිකයෙක් යාවජීව සාමාජිකත්වය ලබා ගැනීම සඳහා රු. 2,400 ක් ගෙවිය යුතුය. මෙම අංශය තේ ශක්ති අරමුදල යටතේ පවතින වැදගත් අංශයක් ලෙස හැඳින්විය හැකිය.

සුභසාධන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා

වසර	ප්‍රතිලාභ ගෙවන ලද සංඛ්‍යාව	ප්‍රතිලාභ වටිනාකම රු.
2014	505	9,471,548.00
2015	537	10,014,315.79
2016	633	12,202,796.00

2014 වර්ෂයේ සිට තේ ශක්ති සමාජ සුභ සාධන රක්ෂණ ක්‍රමය සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. නමුත් 2016 වර්ෂයේදී ප්‍රතිලාභීන් 633 ක් සඳහා ප්‍රතිලාභ වශයෙන් රු. 12,202,796.00 ගෙවා ඇත.

කොටස්කරුවන්/ සමකොටස්

(රු.)

1. ශ්‍රී ලංකා රජය (ආරම්භක ප්‍රාග්ධනය) **437,505,030.22**

11. කුඩා තේ වතු හිමියන්

අ. කොටස්කරුවන්ගේ දායකත්වය (පාර්ශවකරුවන්) **206,014,150.00**

ආ. තේ ශක්ති සාමාජික දායකත්වය **135,243,850.00**

කොටසක මූලික ආදායම 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා

වර්ෂය	**කොටසක මූලික ඉපයීම (රු.)**
2012	3.93
2013	(2.88)
2014	(6.20)
2015	(1.90)
2016	(1.48)

<u>තේ ශක්ති කොටස් නිකුතුව පිළිබඳ විස්තර</u>

මිලදී ගත් කොටස් ගණන	**මිලදී ගත් කොටස් හිමියන්**
1 - 24	19,781
25 - 50	18,342
51 - 100	19,876
101 - 200	16,883
201 - 300	6,007
301 - 400	1,243
401 - 500	3,784
501 - 1,000	4,985
1001 - 2,000	1,835
2001 - 3,000	775
3,001 - 4,000	101
4,001 - 5,000	476
5,001 - 10,000	333
10,001 <	4
මුළු එකතුව	**94,425**

2002 වර්ෂයේදී තේ ශක්ති කොටස් නිකුතුව ආරම්භ කළ අතර, එමඟින් රු. 10/- වටිනාකමකින් යුතු කොටස් නිකුත් කරන ලදී. කොටස් 20,900,000 ක් තේ ශක්ති සාමාජිකයින් 94,425 කට නිකුත් කරමින් රු. 209,000,000/- උපයා එම මුදල තේ ශක්ති අරමුදල ස්ථාපනය කිරීම සඳහා යොදවා ඇත.

තේ ශක්ති අරමුදල

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන	2016	2015
ආදායම	6	100,639,857	573,519,262
විකුණුම් පිරිවැය		(147,060,681)	(552,517,570)
දළ ලාභය		**(46,420,824)**	**21,001,692**
වෙනත් ආදායම්	7	152,340,999	43,844,841
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		-	(14,928,507)
පරිපාලන වියදම්		(178,445,015)	(188,377,711)
මෙහෙයුම් ලාභය/(අලාභය)		**(72,524,840)**	**(138,459,685)**
පොලී ආදායම	8	588,508	394,909
පොලී වියදම	8	(2,343,609)	(20,468,018)
රජයේ ප්‍රදාන ලියාහැරීම් ආපසු ගැනීම		43,750,503	119,300,503
බදු පෙර ලාභය /(අලාභය)		**(30,529,438)**	**(39,232,291)**
ආදායම් බදු වියදම		-	-
වසරේ ලාභය /(අලාභය)		**(30,529,438)**	**(39,232,291)**
කොටසක මූලික ඉපයීම/ (අලාභය) (රු.) 11	11	(1.48)	(1.90)
වසරේ ලාභය / (අලාභය)		**(30,529,438)**	**(39,232,291)**
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-
මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)		**(30,529,438)**	**(39,232,291)**

05 සිට 25 දක්වා පිටුවල එන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

තේ ශක්ති අරමුදල

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	2016	2015
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**12**	272,543,007	285,261,613
අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග	**13**	2,600,000	2,600,000
ආයෝජන දේපල	**14**	31,709,123	33,433,585
පරිනත / අපරිනත වගාව	**15**	13,932,571	14,158,054
ස්ථාවර තැන්පතුවල ආයෝජනය		-	14,879,240
මුළු ජංගම නොවන වත්කම්		**320,784,701**	**350,332,492**
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	**17**	4,387,922	69,590,593
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	**18**	271,543,470	270,897,621
ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ	**19**	2,790,822	2,790,822
මුදල් හා මුදල්වලට සමාන දෑ	**20**	44,134,539	3,181,092
මුළු වත්කම්		**322,856,753**	**346,460,128**
මුළු වත්කම්		**643,641,454**	**696,792,620**
හිමිකම් හා බැරකම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**21**	206,014,150	206,014,150
ප්‍රත්‍යාගණන සංචිතය	**21**	50,249,773	50,249,773
රඳවාගත් ඉපැයුම් (හරට)	**21**	(398,528,527)	(367,912,464)
මුළු හිමිකම්		**(142,264,604)**	**(111,648,541)**
ජංගම නොවන බැරකම්			
සාමාජික දායක මුදල් අරමුදල	**22**	135,243,850	135,221,950
රජයේ ප්‍රදාන	**23**	218,752,515	262,503,018
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම (බඳු කුලී පෙර ගෙවුම්)	**24**	48,833,264	48,833,264
පොලී සහිත ණයගැනීම් - (ජංගම නොවන කොටස)	**25**		6,008,533
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	**26**	59,135,276	28,521,886
මුළු ජංගම නොවන බැරකම්		**461,964,905**	**481,088,651**
ජංගම බැරකම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	**27**	318,946,968	309,758,086
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ	**28**	4,545,276	4,545,276
බැංකු අයිරා	**20**	448,909	13,049,148
		323,941,153	**327,352,510**
මුළු හිමිකම් සහ බැරකම්		**643,641,454**	**696,792,620**

05 සිට 25 දක්වා පිටුවල එන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන්

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති	**පී. එස්. එම්. සේනාධීර**
ලේකම්	**ප්‍රධාන මූල්‍ය නිලධාරි**
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

තේ ශක්ති අරමුදල

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම් (හරට)	එකතුව
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**206,014,150**	**50,249,773**	**(367,912,464)**	**(111,648,541)**
වර්ෂයේ ලාභය/(අලාභය)			**(30,529,438)**	**(30,529,438)**
වසරේ ගැලපුම් සිදු කිරීමට පෙර			**(86,625)**	**(86,625)**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**206,014,150**	**50,249,773**	**(398,528,527)**	**(142,264,604)**

05 සිට 25 දක්වා පිටුවල එන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

Y

තේ ශක්ති අරමුදල
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016	2015
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය		
බදු පෙර ලාභය/(අලාභය)	**(30,529,438)**	**(39,232,292)**
පහත කරුණු සඳහා ගැළපීම් ;		
ක්ෂය වෙන් කිරීම්	14,356,442	31,858,162
රජයේ ප්‍රදාන ලැබීම - පුනරාවර්තන	(150,000,000)	-
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	(43,750,503)	(119,300,503)
පරිනත වගා මත ක්‍රමක්ෂය කිරීම	225,483	860,510
බදු කුලී ක්‍රමක්ෂය කිරීම – සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම	-	(1,166,736)
පාරිතෝෂිත සඳහා වෙන් කිරීම	32,335,941	5,791,088
පොලී ආදායම	(588,508)	(394,909)
පොලී වියදම්	2,343,609	20,468,018
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)	**(175,606,974)**	**(101,116,662)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
භාණ්ඩ තොග	65,202,671	44,460,337
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	(645,849)	(7,845,510)
ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ	-	624,991
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	9,188,883	(5,733,592)
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ	-	946,074
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල්	**(101,861,269)**	**(68,664,362)**
ගෙවූ පාරිතෝෂිත	(1,722,551)	(3,700,585)
ගෙවූ පොලී මුදල්	(2,343,609)	(20,468,018)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය	**(105,927,429)**	**(92,832,965)**
ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	-	(3,762,769)
අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම	-	(165,000)
අපරිනත වගාවන් අත්පත්කර ගැනීම	-	(1,590,656)
ස්ථිර තැන්පතු කල් පිරීමෙන් හා වෙනත් මූල්‍ය වත්කම් වලින් ලත් ආදායම	14,879,240	(6,467,261)
රජයේ ප්‍රදාන ලැබීම්	150,000,000	50,000,000
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමෙන් බදු කුලී කලින් ලැබීම්	-	50,000,000
ලද පොලිය	588,508	394,909
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල	**165,467,748**	**88,409,223**
මූල්‍ය ක්‍රියාකාරම්වල මුදල් ප්‍රවාහය		
සාමාජිකයන්ගේ දායක මුදල්	21,900	37,200
ලබාගත් කාලීන ණය	-	-
ණය ආපසු ගෙවීම	(6,008,533)	(12,372,864)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල	**(5,986,633)**	**(12,335,664)**
වර්ෂය තුළදී මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වෙනස්වීම්	**53,553,686**	**(16,759,406)**
වර්ෂය ආරම්භයේදී පැවති මුදල් සහ මුදල් වලට සමාන දෑ	(9,868,056)	6,891,350
වර්ෂය අවසානයේදී පැවති මුදල් සහ මුදල් වලට සමාන දෑ (සටහන 20)	**43,685,630**	**(9,868,056)**

05 සිට 25 දක්වා පිටුවල එන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

තේ ශක්ති අරමුදල

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.2 පොදු කරුණු

මෙහි මින් මතුවට "අරමුදල" ලෙස හඳුන්වනු ලබන තේ ශක්ති අරමුදල 2000 අංක 47 දරණ පාර්ලිමේන්තු පනත යටතේශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාවේ ස්ථාපිත අරමුදලකි.මෙම අරමුදලේ ලියාපදිංචි කාර්යාලය 10 වන මහල, සෙත්සිරිපාය 2 වන අදියර, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටා ඇත.මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ වන්නේ තරඟකාරී වෙළඳපල තුළ ගුණාත්මක තේ නිෂ්පාදනය මගින් කුඩා තේ වතු හිමියන්ට සාධාරණ මිලකට යෙදවුම් ලබාදීම තුළින් ඔවුන් විසින් නිපදවන තේ දළු සඳහා හොඳ මිලක් ලබා දීම හරහා ඔවුන්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වය නගා සිටුවීමයි.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ තේ සහ පොහොර නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමයි.

1.4 තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම

2016 අප්‍රේල් වන විට, තේ ශක්ති අරමුදලට අයත් තේ කර්මාන්තශාලා දොළහෙන් තුනක් පමණක් ක්‍රියාත්මක විය. කුඩා තේ වතු හිමියන්ගේ තේ දළු සඳහා ගෙවිය යුතු හිඟ මුදල්, කාර්ය මණ්ඩල වැටුප්, කම්කරු වේතන සහ අනෙකුත් දෛනික වියදම් රුපියල් මිලියන 55.8 ක්වූ අතර තේ තැරැව්කරුවන්ගේ ගෙවිය යුතු අත්තිකාරම්/ණය රුපියල් මිලියන 64 කි. මුදල් නොගෙවීම නිසා කර්මාන්තශාලාවල ධාරිතාවට වඩා අඩු තේ දළු ප්‍රමාණයක් ලැබුණු අතර එම කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය කරන ලද තේ අලෙවියෙන් ලැබෙන සියලුම මුදල් තේ තැරැව්කරුවන් විසින් අය කරනු ලැබීය. 2015.12.31 දිනට තේ ශක්ති අරමුදලේ සමුච්චිත අලාභය රුපියල් මිලියන 367.9කි.

එබැවින්, වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් 04.04.2016, 21.06.2016 සහ 21.07.2016 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ තුනක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටින ලද අතර පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දෙන ලදී.

අ. තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු නොපමාව අත්හිටුවීම, එම බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පැවරීම සහ තේ ශක්ති අරමුදලට අදාළව සිදු කෙරෙන ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණ ගැනීම.

ආ. ආයතනය සතු කර්මාන්තශාලා 12හි කළමනාකාරීත්වය බදු පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීම.

ඇ. කුඩා තේ වතු හිමියන්ගේ යහපත උදෙසා පවත්වාගෙන යනු ලබන සුභසාධන රක්ෂණ ව්‍යාපෘතිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පැවරීම.

ඈ. කර්මාන්තශාලා බදු දීමෙන් ලැබෙන ආදායම කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුභසාධක රක්ෂණ ව්‍යාපෘතියෙන් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රුපියල් මිලියන 135ක මුදල ප්‍රතිපූරණය කිරීම සඳහා යෙදවීමට කටයුතු කිරීම සහ ඉන් අනතුරුව ඉතිරි වන බදු ආදායම මහා භාණ්ඩාගාරය වෙත බැර කිරීම.

ඉ. තේ ශක්ති අරමුදල මගින් පවත්වාගෙන යන ලද පොහොර ව්‍යාපෘතිය සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය වසා දැමීමට කටයුතු කිරීම.

ඊ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත, තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් සේවකයින් 46 දෙනා අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතනවල පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම සහ පුරප්පාඩු නොපවතී නම් අධිසේවක පදනම මත ඔවුන් වෙත විශේෂ වන සේ එම ආයතන සඳහා අනුයුක්ත කිරීම.

උ. කම්හල් කාර්ය මණ්ඩලයට අයත් සේවකයින් 74 දෙනෙකුගේ සේවය අවසන් කර කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ හා අදාළ අනෙකුත් පාර්ශ්වයන්ගේ උපදෙස් පරිදි වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, කම්හල්වල සේවය කරන කම්කරුවන් 371 දෙනෙකුගේ සේවය තවදුරටත් ලබා ගැනීමට බදුකරුවන් සමඟ එකඟතාවයකට පැමිණීම සහ එසේ එකඟතාවයකට එළැඹීමට නොහැකි වන්නේ නම්, ඔවුන්ගේ සේවය අවසන් කර ඉහත සඳහන් පරිදි වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

ඌ. තේ ශක්ති අරමුදලේ දෛනික හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන්ගේ සේවය වහාම අවසන් කිරීම.

එ. තැරැව්කරුවන්ගෙන් ලබාගත් ණය පියවීමට, කුඩා තේ වතු හිමියන්ගේ තේ දළු සඳහා ගෙවීම් කිරීමට, කාර්ය මණ්ඩලයේ/කම්කරුවන්ගේ නොගෙවූ වැටුප් හා වේතන ගෙවීමට සහ කෙටි කාලීන වගකීම් නිරවුල් කිරීමට මහා භාණ්ඩාගාරයෙන් තේ ශක්ති අරමුදලට රුපියල් මිලියන 167.87 ක මුදලක් වෙන් කිරීම.

1.5 තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යෝජනා අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කර ඇත.

අ. තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු අත්හිටුවා එම බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා ඇති අතර, ඒ අනුව ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල සියලු කටයුතු ලේකම්වරයා විසින් අවශ්‍ය අවස්ථාවලදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද මුදල් අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ද උපදෙස් විමසමින් ඉටු කර ඇත.

ආ.තේ කර්මාන්තශාලා 11ක, මාවරල පිහිටි තේ වත්තේ සහ හොරණ පිහිටි පොහොර ගබඩා සංකීර්ණයේ කළමනාකාරීත්වය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව වෙනත් පාර්ශවයන් වෙත පවරා ඇත. එකී වත්කම්වල අයිතිය තේ ශක්ති අරමුදල වෙත පවතින ආකාරය සලකා බලා, බදු ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් යටතේ පැවරීම් සිදු කර ඇත. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත බලතල පැවරීමට පෙර 2016 ජුනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත රයිගම්කෝරළේ තේ කර්මාන්තශාලාව කුඩා තේ වතු සංවර්ධන සමිතියක් වෙත බදු පදනම මත පැවරීම සිදු කර ඇත.

ඇ.සුභසාධන රක්ෂණ ව්‍යාපෘතිය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති අතර, දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය වසා දමා ඇත.

ඈ.තේ ශක්ති අරමුදලේ පහත සඳහන් කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කර ඇත.

ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය	19
කම්හල් කාර්ය මණ්ඩලය	67
චෙක්-රෝල් කම්කරුවන්	226

ඉ. තේ ශක්ති අරමුදලේ කාර්ය මණ්ඩලය අතරින්, කළමනාකරණ සහකාරවරුන් 09 දෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකයෙකු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අනුයුක්ත කර ඇත. අරමුදලේ කාර්යයන් කළමනාකරණ සහකාරවරුන් 06 දෙනෙකු, සහකාර කම්හල් නිලධාරියෙකු සහ කාර්යාල කාර්ය සහායකයෙකු විසින් ඉටු කරනු ලැබේ.

2 විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇත. ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ මූල්‍ය ප්‍රකාශ සකසා ඇති අතර දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය සාධාරණ වටිනාකම මගින් නව්‍යකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීම සඳහා අත්‍යාවශ්‍ය ගිණුම් භාවිත කිරීම අවශ්‍ය කෙරේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කිරීමේ ක්‍රියාදාමය තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය කටයුතු කළ යුතු වේ. ඉහළ තලයේ මැදිහත්වීමක් හෝ පෙළඹවීමක් අවශ්‍ය කරන අංශ හෝ මූල්‍ය ප්‍රකාශවලට වැදගත් වන ඇස්තමේන්තු හා උපකල්පිත අවශ්‍ය අංශ සටහන් අංක 4හි දක්වා ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විචල්‍යයන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශවල කාල සීමාවන්ට අදාළව අඛණ්ඩව ඉදිරිපත් කර ඇති අතර, අන්‍යාකාරයකින් සඳහන් කර නොමැත්තේනම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මාරු වූ දිනයේ මූල්‍ය තත්ත්වය ආරම්භක ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව සකසා ඇත.

2.3 ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් ගණුදෙනු සහ ශේෂයන් මනිනු ලබන්නේ, ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල භාවිත කිරීමෙනි. අරමුදල් ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

2.4 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ වත්කම් වර්තමානයේ පිහිටි ස්ථානය වෙත ගෙන යාමට සෘජුව දායක වූ කවර හෝ පිරිවැයක් ද හා කළමනාකාරිත්වය මගින් අදහස් කරන ලද ආකාරයට ක්‍රියාවට නංවාලීමට ඇති හැකියාවට අදාළ කොන්දේසි ඇතුළුව පිරිවැය අගය අනුව මූලිකව හඳුනා ගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම අනුව 2015 දෙසැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සැකසූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව සැලකීමට අරමුදල තීරණය කර ඇත. කල්පිත පිරිවැය, දේපල, පිරියත හා උපකරණ ලෙස සැලකීමෙන් පසුකාලීනව පිරිවැය රහිත සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු ගණනය කෙරේ.

පසුකාලීන පිරිවැය වත්කම් ධාරණ අගයට ඇතුළත් කර හෝ වත්කමක් ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව, අයිතමයක් හා බැඳුනු ඉදිරි ආර්ථික වාසි අත්වන අවස්ථාවක පමණක් ඒවා අරමුදලට එකතු වීමටත් ඒ අනුව අයිතමයක් පිරිවැය විශ්වාසදායකව ගණනය කිරීමට හැකි වනු ඇත. වෙනත් සියළු පිළිසැකසුම් හා නඩත්තුව ඒවා සිදු කළ මූල්‍ය කාල සීමාව තුළ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ඉඩම ක්ෂය කිරීමක් සිදුනොකරන අතර, අනෙකුත් වත්කම්වල ක්ෂයවීම්, ක්ෂයවීම්වල ආසන්න අගයට පැමිණීම සඳහා කපා හරින ලද අගය ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ. වත්කමක පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය කළ මුදල වෙන් කිරීම සඳහා, ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය පහත සඳහන් පරිදි වේ.

වත්කම් කාණ්ඩය	**ප්‍රත්‍යාගණන දිනට අපේක්ෂිත ඵලදායී ආයු කාලය**
ගොඩනැගිලි	වර්ෂ40
පිරියත හා යන්ත්‍රෝපකරණ	වර්ෂ13
ලී බඩු සහ සවිකුරු	වර්ෂ10
මෝටර් රථ	වර්ෂ10
පරිගණක	වර්ෂ 10
උපකරණ සහ මෙවලම්	වර්ෂ10
දුරකථන	වර්ෂ10
පරිනත වගාව - තේ	වර්ෂ33

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත ආපසු අය කරගත හැකි මුදලට වඩා වත්කමක ධාරණ වටිනාකම වැඩිවන අවස්ථාවක එය අය කර ගත හැකි මුදලක් ලෙස ක්ෂණිකව ලියා තබනු ලබයි.

2.5 අස්පෘෂ්‍ය වත්කම්

මිලදී ගත් පරිගණක මෘදුකාංග විශේෂිත මෘදුකාංග හා පද්ධති භාවිතයට ගැනීම සඳහා හා මිලදී ගැනීමට සිදු කළ පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනිත කර ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් ඒවායේ පිරිවැය අගයට දක්වා ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු අඩු කර පිරිවැය අගයට දක්වා ඇත. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය මත පහත පරිදි ක්‍රමක්ෂය කර ඇත.

පරිගණක මාදුකාංග වර්ෂ 5

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමට අදාළ පිරිවැය, දරන ලද වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

2.6 හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම වෙත පවරා දීම

2008 වර්ෂයේ සිට තේ ශක්ති අරමුදල අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් අරමුදල සතු කර්මාන්තශාලා පවත්වාගෙන යාමේ දුෂ්කරතා ඇති වූ බැවින් 2012 වර්ෂයේදී හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය අවබෝධතා ගිවිසුමක් යටතේ, ලාභයෙන් 1/3ක් අරමුදලට ලබාදීමේ පදනම මත සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම වෙත පවරා දෙන ලදී. 2015 වර්ෂයේදී අරමුදල මුහුණ දී තිබූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් එම අරමුදල වෙත රුපියල් මිලියන 50ක ණය මුදලක් ලබා දී ඇත. එම ණය මුදල 11% ක වාර්ෂික පොලී අනුපාතයක් මත වාරික 36 කින් ආපසු ගෙවීමට එකඟවී ඇත. එම අවස්ථාවේ, එවකට අඩක් ඉදිකර තිබූඅරමුදලට අයත් මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ අවශ්‍ය සංවර්ධන කටයුතු සිදුකරපවත්වාගෙන යාම සඳහා සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම වෙත පවරා දෙන ලදී. අරමුදලේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එම ණය මුදල පියවා නොමැත.එබැවින්, එම කර්මාන්තශාලාවල වත්කම්වල ශුද්ධ අගයන් සහ අරමුදල හා සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් කරන ලද ආයෝජන සලකා බැලීමෙන් අනතුරුව,2019 මාර්තු 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබාදී ඇති අනුමැතිය මත එම කර්මාන්තශාලා දෙක සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගමවෙත පවරා දෙන ලදී.

2.7 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු කුලී ආදායම් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකටම අයත් දේපල වුවද ඒවා සාමාන්‍ය ව්‍යාපාර ක්‍රමය තුළින් විකිණීම සඳහා වන ඒවා නොවන අතර, භාණ්ඩ නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

2015 දෙසැම්බර් 31 ට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සකසා ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන අගයට ආයෝජන දේපල ඉදිරිපත් කර ඇත. ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මුදල කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව ආයෝජන දේපල සැලකීමට අරමුදල තීරණය කර ඇත. කුලී ඉපැයීම සඳහා තබා ඇති ආයෝජන දේපල මූලිකව එහි පිරිවැයට මනිනු ලබන අතර පසුව එම දේපල කිසියම් හානි පාඩුවක් වෙතොත් එය අඩු කරපිරිවැයට මනිනු ලැබේ.

පහත දැක්වෙන පරිදි, ගොඩනැගිලි සහ පිරියත හා යන්ත්‍රෝපකරණ ක්ෂයවීම්, ඒවායෙහි ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය මත ඒවායේ පිරිවැය හෝ සැලකූ පිරිවැය වෙන් කිරීම සඳහා (ක්ෂයවීම්වල ආසන්න අගයට පැමිණීම සඳහා) කපා හරින ලද අගය ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ.

ගොඩනැගිලි	වර්ෂ 29
පිරියත හා යන්ත්‍රෝපකරණ	වර්ෂ 13

2.8 ජීව විද්‍යාත්මක වත්කම් – පරිනත හා අපරිනත වගාව

ජීව විද්‍යාත්මක වත්කම්, පරිනත ජීව විද්‍යාත්මක වත්කම් හා අපරිනත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අස්වැන්න නෙලිය හැකි වර්ග පරිනත ජීව විද්‍යාත්මක වත්කම් වේ. පරිනත ජීව විද්‍යාත්මක වත්කම් යනු අස්වැන්න ලබා දෙන හෝ නිතිපතා අස්වැන්න අත්කර දෙන ඒවා වේ. අපරිනත ජීව විද්‍යාත්මක වත්කම් යනු මෙතෙක් අස්වැන්න ලබා නොදෙන ඒවා වේ. තේ හා දැවමය වගාවන් ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වේ.

ඉඩම් සැකසීම, නව වගාව හා නැවත වගාව සහ පොහොර යෙදීම සඳහා පැල සිටුවීම හා අස්වැන්න නෙලීම අතර කාලය තුළ දරන ලද පිරිවැය අපරිනත වගා ලෙස වර්ගීකරණය කර ඇත. මෙම අපරිනත වගාවන් ඍජු පිරිවැය සහ ආරෝපණය කළ හැකි පොදු කාර්ය සඳහා දක්වා ඇත.

ජීව විද්‍යාත්මක වත්කම්, භාරක ජීව විද්‍යාත්මක වත්කම් සහ පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස තවදුරටත් වර්ගීකරණය කෙරේ. භාරක ජීව විද්‍යාත්මක වත්කම්වලට විකිණීමට හෝ අස්වැන්න නෙලීමට අදහස් නොකරන තේ පැල ඇතුළත් වන අතර, එහෙත්, අස්වනු ලබා දෙන කෘෂිකාර්මික නිෂ්පාදන වගා කිරීම සඳහා යොදා ගැනේ. ජීව විද්‍යාත්මක වත්කම්වලින් කෘෂිකාර්මික නිෂ්පාදන ලෙස අස්වනු නෙළීමට හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස විකිණීමට ඇති දැව වගාව පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට ඇතුළත් වේ.

වර්ෂය තුළදී ඵල දරනු ලබන භාරක ජීව විද්‍යාත්මක වත්කම් සඳහා දරන ලද වියදම් පරිනත වගාවන්ට මාරු කර ඇත. පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සිදු කළ වියදම් මූලික හඳුනා ගැනීමේ දි වන පිරිවැයක් ලෙස දක්වා ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම් පාලනය කරන අවස්ථාවකදී පමණක් අරමුදල ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගැනීම සිදු කරන අතර, වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට ඉඩ ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීයව මැනිය යුතුය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද රීතියට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක LKAS16 - දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාරව, භාරක ජීව විද්‍යාත්මක වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු ඇත්නම්, ඒවා පිරිවැයෙන් අඩු කිරීමෙනි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක LKAS 41 ප්‍රකාරව දැවමය වගාවන් මූලිකව හඳුනා ගැනිමට හා දක්වා සිටින එක් එක් කාලය අවසානයේ පිරිවැය අඩු කර සාධාරණ අගයට විකිණීමට ගණනය කරනු ලැබේ.

2.9 මූල්‍ය නොවන වත්කම්වල හානි පාඩු

වත්කම්වලට හානි පාඩු සිදුවී ඇත්දැයි නිශ්වය කර ගැනීම සඳහා දක්වා සිටින එක් එක් කාල සීමාව අවසානයේ, අරමුදලේ දේපල, පිරියත, උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා ආයෝජන දේවල භාරක අගයන් අරමුදල සැලකිල්ලට ලක් කරයි. එවැනි කිසියම් හැඟවීමක් ඇති අවස්ථාවක, හානි පාඩු ප්‍රමාණය දැන ගැනීම සඳහා වත්කමෙහි අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ. පුද්ගල වත්කමක අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වන අවස්ථාවක, මුදල් උත්පාදන ඒකකය (CGUs) කුමක්දැයි අරමුදල තීරණය කර වත්කම අයත් මුදල් උත්පාදන ඒකකයේ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ.

අයකර ගත හැකි මුදල යනු සාධාරන වටිනාකම, විකිනීමේ පිරිවැය හා භාවිත කිරීමේ වටිනාකම අඩු කල පසු ලැබෙන අගයයි. ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවල වටිනාකම තක්සේරු කිරීමේ දී, මුදල්වල කාලීන වටිනාකම්වල වෙළඳපල තක්සේරුව හුවා දක්වන මුදල් ප්‍රවාහ බදු පෙර වට්ටම් අනුපාතයට සත්‍ය වටිනාකමට හා ගැලපුම් කර නැති ඉදිරි මුදල් ප්‍රවාහ සඳහා වන වත්කමට අදාළ අවදානම් වට්ටම් කෙරේ.

වත්කමක ආපසු අයකර ගත හැකි මුදල එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇති අවස්ථාවක, වත්කමෙහි ධාරණ අගය එහි ආපසු අයකර ගහ හැකි මුදලකට අඩු කෙරේ. හානි පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂණිකව හඳුනා ගැනේ.

2.10 මූල්‍ය වත්කම්

(අ) වර්ගීකරණය

අරමුදල තම මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනා ගැනීමේ දි තීරණය කරන අතර පහත දැක්වෙන ආකාරයට මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ:

ණය සහ ලැබියයුතු දෑ

ණය සහ ලැබියයුතු දෑ යනු ස්ථිර හෝ නිශ්වය කළ හැකි ගෙවීම්වලින් සමන්විත ව්‍යුත්පන්න නොවන සක්‍රිය වෙළඳපලේ මුදා හැර නැති මූල්‍ය වත්කම් වේ. වාර්තා කරන දිනය අවසානයට පසුව මාස 12 කට වැඩි කල්පිරීමක් වන දෑ හැර ණය හා ලැබිය යුතු දෑ සථා වත්කම් තුළ අඩංගු වන අතර ඒවා සථා නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අරමුදලේ ණය හා ලැබිය යුතු දෑ අතර වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ, කාලීන තැන්පත්/ අත්තිකාරම්/ පූර්ව ගෙවීම් හා තැන්පත්වල ආයෝජන සහ වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ.

(ආ) හඳුනාගැනීම හා මූලික මිනුම

ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් අරමුදල ගණුදෙනුව ආරම්භකළ දිනයේ සිට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වත්කම් මූල්‍ය ලේඛණයේ ගිවිසුම් ප්‍රතිපාදනය සඳහා අරමුදල පාර්ශ්වකරුවෙකු බවට පත් වන වෙළඳ දිනයේ දී හඳුනා ගැනීමට ලක් කර ඇත.

මූල්‍ය වත්කම් මූලික වශයෙන් ගණුදෙනු පිරිවැයට සෘජුවම බලපාන ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමක් ඇති වත්කම්වලදී සාධාරණ වටිනාකම එකතු කර ගණනය කෙරේ.

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහය ලබා ගැනීමට හිමිකම අහෝසි වි ඇති හෝ මාරු කර ඇති අවස්ථාවක මූල්‍ය වත්කම් නොසළකා හැරෙන අතර මූල්‍ය වත්කම්වල හිමිකාරීත්වයේ සියලු අවදානම් හා වාසි පසුකාලීනව අරමුදලට හිමිවේ.

(ඇ) පසුකාලීන මිනුම

මූලික හඳුනා ගැනීමෙන් පසුව, හානි පාඩු සඳහා ප්‍රතිපාදනය අඩුකර, සඵල පොලී ක්‍රමය යොදා ගනිමින් ණය හා ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මනිනු ලැබේ.

(ඈ) මූල්‍ය වත්කම්වල හානි පාඩු

මූල්‍ය වත්කමක් හානිවී ඇති බවට පරමාර්ථික සාක්ෂි තිබේද යන්න අරමුදල විසින් එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ තක්සේරුවක් සිදු කරනු ලැබේ. වත්කම (පාඩු ලබන අවස්ථාවක) මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් ඇති වීමේ ප්‍රතිඵලයක් ලෙස හානිය සඳහා පරමාර්ථික සාක්ෂි ඇති අවස්ථාවකදී පමණක් මූල්‍යමය වත්කමක් හානිවී, හානි පාඩු ඇති වන අතර පාඩු සිදුවීම (හෝ සිදුවීම්) මගින් විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහය කෙරේ බලපෑමක් ඇති කරවයි.

ක්‍රමක්ෂය වියදම් යටතේ රැගෙන යන ණය සහ ලැබිය යුතු දෑ සඳහා, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ මූල්‍ය වත්කම්වල මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කර ඇති ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දරා නොමැති අනාගත ණය පාඩු හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසය. මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු වන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

පසු අවස්ථාවකදී, හානි පාඩු ප්‍රමාණය අඩු වුවහොත් එම අඩුවීම හානි පාඩු හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමක් ලෙස සැලකිය හැකි අතර මීට පෙර හඳුනාගත් අගය පහත වැටීමේ නිවැරදි කිරීම් සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

2.11 භාණ්ඩ තොග

(අ) ජීව විද්‍යාත්මක වත්කම්වල කෘෂිකාර්මික නිෂ්පාදනවලින් නිපදවූ නිමි භාණ්ඩ

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට භාණ්ඩ තොග දක්වා ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි විය හැකි වටිනාකම යනු නිමැයුම් පිරිවැය හා විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිල වේ.

(ආ) පොහොර

සහනාධාර අඩුකොට පිරිවැය මත භාණ්ඩ තොග දක්වා ඇත. බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය භාවිතා කරමින් පිරිවැය තීරණය කර ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. මිශ්‍ර පොහොරවල පිරිවැය තුළ අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, වෙනත් සෘජු වියදම් හා ආශ්‍රිත නිෂ්පාදන පොදු කාර්ය අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි විය හැකි වටිනාකම යනු අදාළ විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල සහනාධාර වටිනාකම වේ.

(ඇ) ජීව විද්‍යාත්මක වත්කම්වලින් නෙලාගත් කෘෂිකාර්මික නිෂ්පාදන

අස්වැන්න ලබන අවස්ථාවේ විකිණීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය අඩුකර ඒවායේ සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලත් නිමි හා අර්ධ නිමි භාණ්ඩ තොග, කෘෂිකාර්මික නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කිරීම මගින් අගය කරනු ලැබේ.

2.12 වෙළඳ ලැබිය යුතුදෑ

වෙළඳ ලැබිය යුතුදෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාණ්ඩ විකිණීම වෙනුවෙන් ගණුදෙනුකරුවන්ගෙන් අයවීමට නියමිත මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් ක්‍රමවේදය (වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ) මගින් මුදල් එකතු කර ගැනීමට අපේක්ෂා කරන අතර, වෙළඳ ණයගැතියන් සත්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. වෙළඳ ලැබිය යුතුදෑ මූලිකව සාධාරණ වටිනාකම (ඉන්වොයිස් වටිනාකම) මත හඳුනාගෙන ඇති අතර, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලැබෙනු ඇතැයි විශ්වාස කරන අගය අඩුවීම් සඳහා ප්‍රතිපාදන සැලසීමකින් තොරව සත්‍ය ඉන්වොයිස් වටිනාකමට පසුකාලීනව ගණනය කරනු ලැබේ.

එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදී වෙළඳ ලැබිය යුතුදෑ හානි වී ඇති බවට පරමාර්ථික සාක්ෂි තිබේදැයි අරමුදල තක්සේරු කරනු ලැබේ. ගෙවීම් ඒකරාශි කිරීම, ණයකරුවන්ගේ සැළකිය යුතු මූල්‍ය ගැටලු සහ ගෙවීම් පැහැර හැරීම ඇතුළු අරමුදලේ පසුගිය අත්දැකීම් වෙළඳ ලැබිය යුතුදෑ හානිවීම පිළිබඳ පරමාර්ථික සාක්ෂිවලට අඩංගු වේ. වෙළඳ ලැබිය යුතුදෑ හානිවී ඇති අතර, හානිවීම පිළිබඳ පරමාර්ථික සාක්ෂි තිබෙනම්, එකී හානිපාඩු සිදු වි ඇත. හානිවීම සඳහා වෙළඳ ලැබිය යුතුදෑ වෙන් වෙන්ව තක්සේරු කර ඇත.

2.13 මුදල් හා මුදල්සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතේ ඇති මුදල්, බැංකු සමඟ කරන ලද කාලීන තැන්පතු, මාස තුනක මුල් කල්පිරීමක් සහිත හෝ ඊට අඩු බැංකු අයිරාවක් සහිත වෙනත් කෙටි කාලීන ඉතා ද්‍රවශීල ආයෝජන ඇතුළත් වේ.

2.14 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස වර්ගීකරණය කර ඇත.

2.15 මූල්‍ය බැරකම්

අරමුදල, මූල්‍ය බැරකම් වෙනත් මූල්‍ය බැරකම්වලට වර්ගීකරණය කරනු ලැබේ. අරමුදලේ වෙනත් මූල්‍ය බැරකම්වලට වෙළඳසහ අනෙකුත් ගෙවිය යුතු දෑ හා පොලී සහිත ණය ඇතුළත් වේ. වෙනත් මූල්‍ය බැරකම් මුලින් හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් සහ සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැයක් යටතේය. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම මූල්‍ය බැරකම් සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කෙරේ.

අරමුදල එහි කොන්ත්‍රාත් බැඳීම් අවසන් වූ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

2.16 වෙළඳ ගෙවිය යුතුදෑ

වෙළඳ ගෙවිය යුතුදෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබාගත් භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවීමට ඇති බැරකමිය. වෙළඳ ගෙවිය යුතුදෑ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළ (වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ) ගෙවිය යුතු වන්නේ නම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොවන අවස්ථාවකදී, ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළඳ ගෙවිය යුතුදෑ මූලිකව සාධාරණ අගයට (ගනුදෙනුකරන මිල) හඳුනා ගනු ලබන අතර ඒවා පසුකාලීනව සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළ ගෙවීමට අදහස් කරන බැවින් ගනුදෙනුකරණ මිලට ගණනය කරනු ලැබේ.

2.17 ණය ගැනීම්

ණය ගැනීම් සාධාරණ අගය එනම්, දරන ලද ශුද්ධ ගනුදෙනු පිරිවැය මත මූලිකව හඳුනා ගැනේ. සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ණය ගැනීම් පසුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ සිදු කෙරේ. පාවෙන අනුපාතික ණය ගැනීම් එම කාලපරිච්ඡේදය තුළ පවතින පාවෙන පොලී අනුපාතිකය (සඵල පොලී අනුපාතිකය) භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ එක් එක් පසු කාලසීමාව තුළ මනිනු ලැබේ. නෛතික සහ ලේඛන ගාස්තු ණය ගැනීම්වල ගනුදෙනු පිරිවැය ලෙස හඳුනා ගැනේ.

2.18 ණය ගැනීම් පිරිවැය

ණය ගැනීමේ පිරිවැය ඒවාදරනු ලබන කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.19 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට හා අරමුදල කොන්දේසි සියල්ල සපුරාලන බවට සැලකිය යුතු සහතිකයක් ඇති අවස්ථාවක රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරන අගයට හඳුනා ගැනේ.

වන්දි පූර්ණය කිරිමට සිදු වන ආනයන පිරිවැයට අදාළ පොහොර සහනාධාර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සහනාධාර ලැබෙන බවට ප්‍රමාණවත් සහතිකයක් ලබා දී ඇති දැනටමත් වියදම් කර ඇති ආනයන පිරිවැය සඳහා හානි පූර්ණය කළ යුතු පොහොර සහනාධාර ලැබිමට නියමිත සහනාධාර ලෙස හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණවලට අදාළ රාජ්‍ය ප්‍රදාන විලම්බිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කර ඇති අතර, සරල රේඛීය පදනම මත අදාළ වත්කම්වල අපේක්ෂිත ආයු කාලය අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත.

මූල්‍යමය නොවන ප්‍රදාන මූල්‍යමය නොවන ධාරණ අගය ධාරණ අගයේ ප්‍රදාන හා වත්කම් යන දෙකම සළකා ගණනය කෙරේ.

2.20 ප්‍රවර්තන හා විලම්භිත බදු

අදාළ කාල සීමාව සඳහා බදු වියදම තුළ ප්‍රවර්තන හා විලම්බිත බදු ඇතුළත් වේ. වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇති අයිතම හැර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ බදු හඳුනාගෙන ඇත. මෙහිදී, වෙනත් විස්තීර්ණ ආදායමෙහි බදු හඳුනා ගැනීමක් කර ඇත. සථ්‍ය බදු අය කිරීම් දක්වා සිටින කාලයේ අරමුදල විසින් අනුගමනය කරන හා උපයන බදු ආදායමට අදාල බදු නීති අනුව ගණනය කෙරේ. වත්මන් ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ බදු අය කළ හැකි ආදායමක් උත්පාදනය කිරීම සඳහා අදාළ වන වාර්තාකරණ කාල සීමාව අවසානයේ පනවන ලද බදු නීති මත පදනම්වය. බදු බලධාරීන්ට ගෙවීමට අපේක්ෂා කරන මුදලේ වර්ගය අනුව සුදුසු පරිදි කලමනාකාරිත්වය විසින් ප්‍රතිපාදන වෙන් කෙරේ.

වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇති වන තාවකාලික වෙනස්කම් මත හා මූලා ප්‍රකාශවල ධාරණ අගයන් අනුව විලම්බිත බදු හඳුනා ගැනේ. ගිණුම්වලට හෝ බදුමය ලාභයට හෝ පාඩුවට අදාළ නොවන ව්‍යාපාරික සම්බන්ධයක් නොවන ගණුදෙනුවක් නිසා වන වත්කමක හෝ වගකීමක මූලික හඳුනා ගැනීමෙන් ඇති වන්නේනම් විලම්බිත බදු නොසළකා හැරේ. එහි දක්වා සිටින කාලයේ අවසන් දිනයට බලාත්මක බදු අනුපාත මත විලම්බිත බදු තීරණය කරන අතර අදාළ විලම්බිත බදු වත්කම අත්කර ගත් පසු හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවා ඇති අවස්ථාවක අදාළ කර ගැනීමට අදහස් කෙරේ.

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි අනාගත බදු අය කළහැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු වගකීම්වලට හිලව් කිරීමට නීතිමය බලය පවරන හිමිකමක් ඇති අවස්ථාවක හා එකම බදු ආයතනය විසින් පනවනු ලබන ආදායම් බදුවලට අදාල විලම්භිත බදු වත්කම් හා වගකීම් ඇති අවස්ථාවක විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලවු කරනු ලැබේ.

2.21 සේවක ප්‍රතිලාභ

අරමුදල සතුව නිශ්චිත ප්‍රතිලාභ හා නිශ්චිත දායකත්ව සැළසුම් යන දෙකම පවතී.

(අ) නිශ්චිත දායකත්ව සැළැස්ම

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු අරමුදල විසින් වෙනම ආයතනයක් වෙත ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැළැස්මකි. තවදුරටත් දායක මුදල් ගෙවීම සඳහා අරමුදලට කිසිදු නෛතික හෝ සාධනීය බැඳීම් නොමැත. දායක මුදල් ගෙවිය යුතු විට ඒවා සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගැනේ.

අරමුදල මගින් සේවක අර්ථසාධක අරමුදලට කර්මාන්තශාලා සේවකයන් සඳහා දල පාරිශ්‍රමිකවලින් 12% ක දායකත්වයක් හා වෙනත් සේවකයන් සඳහා 15% ක දායකත්වයක් ලබාදෙන අතර සේවක භාරකාර අරමුදල සඳහා සේවකයාගේ දල පාරිශ්‍රමිකවලින් 3% ක දායකත්වයක් ලබාදේ.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සම්බන්ධයෙන් අරමුදල් බැඳීම යනු වාර්තාකරණ කාල සීමාව අවසානයේ වූ නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම වාර්ෂිකව මනිනු ලබන්නේ පාරිතෝෂිත සූත්‍රය භාවිත කර ගණනය කරන ලද අපේක්ෂිත ඒකක ණය ක්‍රමය භාවිත කරමිනි.නිශ්චිත ප්‍රතිලාභ බැදීම්වල සථ්‍ය වටිනාකම සේවකයන් හා පෙර කාල සීමාවලදී තම සේවා සැපයීම මගින් උපයන ලද ඇස්තමේන්තු කළ ඉදිරි ප්‍රතිලාභ සඳහා වට්ටම් කිරිමෙන් නිශ්චය කරනු ලැබේ.

උපකල්පනවල වෙනස්වීම්, වත්මන් සේවා පිරිවැය සහ පොලී වෙනස්වීම්වලින් පැන නගින ලාභ සහ අලාභ ඒවා පැන නගින කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් මනිනු ලබන්නේ සේවකයින් විසින් සපයනු ලබන අදාළ සේවාවන් සඳහා ගෙවීමට අපේක්ෂා කරන වට්ටම් රහිත මුදලක් මත ය.

2.22 ප්‍රතිපාදන හා අසම්භාව්‍ය බැරකම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට නීත්‍යානුකූල හිමිකම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා වන ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර, ඇතැම් විට අරමුදලෙන් ආර්ථික සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වන අතර ප්‍රමාණයන් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

ශේෂ පත්‍ර දිනය වන විට විභාග වෙමින් පවතින නීතිමය නඩුවල තත්ත්වය වන්නේ තේ ශක්ති අරමුදල විවිධ පාර්ශ්වයන්ට එරෙහිව නඩු 14ක් පවරා තිබීම වන අතර ඉන් නඩු 2ක් සඳහා දිසා අධිකරණය විසින්තේ ශක්ති අරමුදලට පක්ෂව තීන්දුව ලබා දී තිබුණත් අදාළ පාර්ශ්ව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

පාර්ශව 142ක් තේ ශක්ති අරමුදලට එරෙහිව නඩු පවරා තිබූ අතර එහි ප්‍රතිඵලය ශේෂ පත්‍ර දිනයේදී සාධාරණ ලෙස තහවුරු කර ගත නොහැකි විය.

වර්තමාන බැඳීම හා සම්බන්ධ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් ඇතුළුව, වාර්තා කරන දිනයේ පවතින වඩාත්ම විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව, වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන මනිනු ලැබේ.

සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ නොවේ නම් මිස සියලු අසම්භාව්‍ය බැරකම්මූල්‍ය ප්‍රකාශ සඳහා සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

2.23 ආදායම් හඳුනාගැනීම

සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ. ආදායම ලත් හෝ ලැබීමට ඇති මිලෙහි සාධාරණ අගයට ගණනය කරනු ලබන අතර, ශුද්ධ අගය එකතුකළ බදු (VAT) හා ජාතික ගොඩනැගීමේ බද්දෙහි (NBT) සඳහන් අරමුදලේ ක්‍රියාකාරකම් වලදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන මුදල දැක්වේ. ආදායම් මුදල විශ්වාසදායිව මැණිය හැකි අවස්ථාවක හා ඉදිරි ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට හැකි තත්ත්වය තුළ ආදායම් ප්‍රමාණය අරමුදල හඳුනා ගනී.

එක් එක් හඳුනාගත හැකි ප්‍රධාන ආදායම් මාර්ග සඳහා අරමුදල පහත දක්වා ඇති ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකඅදාළ කරයි.

(අ) භාණ්ඩ අලෙවිය

භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩවල අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත ලැබී ඇති අවස්ථාවේදී, එනම් ගබඩාවලින් භාණ්ඩ ලබා දෙන අවස්ථාවේදීය.

(ආ) තේ තැරැව්කරුවන්ට අලෙවි කිරීම්

තේ තැරුව්කරුවන් හරහා සිදු කළ තේ අලෙවිය මගින් ලත් ආදායම තේ වෙන්දේසියේදී තේ තැරැව්කරුවන් විසින් පාරිභෝගිකයාට විකුණා භාරදුන් භාණ්ඩ වල අවදානම් හා ප්‍රතිලාභ මත හඳුනාගෙන ඇත.

තැරැව්කරුවන්ට තේ අලෙවියෙන් ලැබෙන ආදායම වාර්තා කිරීමේදී, 2015.12.31 දිනට තැරැව්කරුවන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය, මුදල් වර්ෂය තුළ ලැබුණු සහ පියවූණය/අත්තිකාරම් සලකා බලනු ලැබේ. තැරැව්කරුවන් දන්වා ඇති පරිදි, තේ තැරැව්කරුවන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් මුදල් වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම පියවා ඇත.

(ඇ) පොලි ආදායම

සඵල පොලී ක්‍රමවේදය යොදා ගනිමින් පොලි ආදායම් හඳුනා ගෙන ඇත.

(ඈ) දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලද ලාභ සහ අලාභ

අපහරණය මගින් ඇතිවන ලාභසහ අලාභ නිශ්චය කරනු ලබන්නේ එයින් උපයන ලද මුදල ධාරණ අගය සමඟ සන්සන්දනය කිරීමෙන් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

(ඉ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගෙන ඇත.

2.24 වියදම්

මෙහෙයුම් පවත්වාගෙන යාමේදී දරන ලද වියදම් වාර්තාකරණ කාලසීමාව තුළ ලාභ ඉපයීම සඳහා වන ආදායමයි.තේ කම්හල් විසින් දරන ලද වියදම් 2015.12.31 දිනට කර්මාන්තශාලාවල මුදල් සහ බැංකු ශේෂයන්, කර්මාන්තශාලා වෙත මාරු කරන ලද අරමුදල් සහ මුදල් වර්ෂය තුළ කර්මාන්තශාලාවලින් ලැබුණු මුදල්/බැංකු ශේෂයන් සැලකිල්ලට ගනිමින් වාර්තා කරනු ලැබේ.

2.25 වාර්තාකරණ කාලසීමාවට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන කාල සීමාවට පසුව සිදු වූ ද්‍රව්‍යාත්මක සිදුවීම් සියල්ල කෙරේ අවධානය යොමු කර සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන්වල සිදු කර ඇත.

2.26 බැදීම්

අදාල කාල සීමාව අවසානයේදී, ද්‍රව්‍යාත්මක බැදීම් සියල්ල හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවල සටහන් මගින් අනාවරණය කර ඇත.

3. විශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී කළමණාකරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම හා වියදම් හඳුනාගැනීම හා මිනුම පිළිබඳව විනිශ්චයන්, ඇස්මේන්තු හා උපකල්පනයන් කිහිපයක් සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වඩාත් විශේෂී ලෙස බලපාන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දක්වා ඇත.

(අ) විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම

හඳුනා ගත හැකි විලම්භිත බදු වත්කම්වල ප්‍රමාණය විලම්භිත බදු ආදායම භාවිත කළ හැකි ඉදිරි බදු ආදායම් ප්‍රමාණයේ තක්සේරුව මත පදනම් වනු ඇත.

වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් හඳුනා ගැනීම හා මැනිම කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දැක්වේ:

(ආ) ක්ෂයවිය හැකි වත්කම්වල ඵලදායී ආයුකාලය

ක්ෂයවිය හැකි වත්කම්වල ඵලදායී ආයු කාලයේ තක්සේරුව කළමනාකාරිත්වය විසින් දන්වා සිටින දිනට වත්කම්වල අපේක්ෂිත ආර්ථික උපයෝගිතාවය මත පදනම්ව විමසුමට ලක් කරයි. මෙම ඇස්තමේන්තුවල ඇති අනියතතාවයන් ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණ භාවිතා කිරීම වෙනස් කිරීමට හේතු විය හැකි තාක්ෂණ හැකියාවට අදාළ වේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම්වල සත්‍ය වටිනාකම උපකල්පන රැසක් භාවිතා කරමින් යෝජිත ඒකක ණය පදනම මත රඳා පවතින කරුණු රැසක් මත තීරණය වේ. ශුද්ධ පිරිවැය හා වට්ටම් අනුපාතය ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වන බැඳීම 26 වන සටහනෙහි දක්වා ඇත. මෙම උපකල්පනවල කිසියම් වෙනසක් ඇතිවීම නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගයට බලපෑමක් සිදු කෙරෙනු ඇත.

4. SLFRS/LKAS ප්‍රථම වරට යොදා ගැනීම

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව ප්‍රථමවරට සැකසූ මූල්‍ය ප්‍රකාශ වේ. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව දක්වා ඇතුළු පෙර වාර්තාකරණ කාලසීමාවන් දක්වා කාලයන්ට අදාළව අරමුදල විසින් තම මූල්‍ය ප්‍රකාශ 2011 දෙසැම්බර් 31 දක්වා වන තෙක් බලපැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLAS) අනුකූලව සකස් කරන ලදී.

4.1 අතීතානුයෝගී යෙදුම මගින් විකල්පමය නිදහස් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව පළමු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRSs) අතීතානුයෝගී යෙදුමෙන් පහත විකල්ප නිදහස් කිරීම් අයදුම් කිරීමට අරමුදල තෝරාගෙන ඇත.

සාධාරණ අගය හෝ කල්පිත පිරිවැය ලෙස ප්‍රත්‍යාගණනය

2011 දෙසැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මිලට දක්වා ඇත. ප්‍රත්‍යාගණන දිනට සාධාරණ වටිනාකමට බොහෝ සේ සැසඳෙන බැවින් එම ප්‍රත්‍යාගණන මුදල ප්‍රත්‍යා ගණනය කළ දිනට කල්පිත පිරිවැයක් ලෙස අරමුදල සළකනු ලැබේ.

4.2 පහත දැක්වෙන විකල්ප ව්‍යාතිරේක ගිණුම් ප්‍රමිතීන් තේ ශක්ති අරමුදල ගිණුම් සකස් කිරීමට අදාළ නොවේ:

අ. SLFRS 4 - මෙම යෙදවුම අරමුදල්වලට අදාළ නොවන බැවින් ආරක්ෂණ ගිවිසුම්

ආ. IFRIC 4 - අරමුදල සතුව එවැනි වැඩපිළිවෙල නොමැති බැවින් වැඩපිළිවෙලක බද්දක් ඇතුළත්ව තිබේදැයි තිරණය කිරීම

ඇ. LKAS 19 - අරමුදල සූත්‍ර ක්‍රමය භාවිතා කරමින් තම නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මිනුම්කරණ බැවින් සේවක ප්‍රතිලාභ

ඈ. LKAS 21 - අරමුදල සතුව විදේශ මෙහෙයුම් නොමැති බැවින් සමුච්චිත පරිවර්තන විනිමය විචල්‍යතා

ඉ. LKAS 27- අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින් අනුබද්ධිත ආයතන, හවුල් පාලන ආයතන හා සංගම්වල ආයෝජන

ඊ. අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින් අනුබද්ධිත ආයතන, සංගම් හා හවුල් ව්‍යාපාරවල වත්කම් හා බැරකම්

උ. LKAS 32 - සංයුක්ත මූල්‍ය උපකරණ අරමුදල සතුව නොමැති බැවින් සංයුක්ත මූල්‍ය උපකරණ

ඌ. LKAS 39 - පෙර වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ අරමුදලට AFS සහ FVTPL මූල්‍ය උපකරණ නොමැති බැවින්පෙර හඳුනාගත් මූල්‍ය උපකරණ නම් කිරීම

එ. දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධව ඉවත් කිරීමේ බැරකම් අරමුදල සතුව නොමැති බැවින් ඉවත් කිරීමේ බැරකම් දේපල, පිරියත සහ උපකරණවල පිරිවැයට ඇතුළත් කර ඇත.

ඒ. IFRIC 12 - එවැනි වැඩපිළිවෙළක් අරමුදල සතුව නොමැති බැවින්,සේවා සහන වැඩපිළිවෙළ

4.3 අතීතානුයෝගී යෙදුම මගින් අනුගම්‍ය ව්‍යාතිරේකයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව ප්‍රථම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRS) අතීතානුයෝගී යෙදුමෙන් පහත සඳහන් විකල්ප ව්‍යාතිරේක යෙදීමට අරමුදල බලාපොරොත්තු වේ.

1. ගිණුම්කරණ ඇස්තමේන්තු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (SLFRSs) මාරු වීමේ දිනය වන විට හා 2011 දෙසැම්බර් 31 දිනට වන සියළු ගිණුම්කරණ ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඇස්තමේන්තුවලට අනුව සකසා ඇත.

2. පහත දැක්වෙන අනුගම්‍ය ව්‍යාතිරේකයන් අරමුදලට අදාළ නොවේ:

අ. මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා නොගැනීම
ආ. හෙජ් ගිණුම්කරණය (Hedge Accounting)
ඇ. පාලනය නොවන පොලී

5. SLFRSs වෙත මාරුවීම පිළිබඳව පැහැදිලි කිරීම

2 සිට 4 දක්වා වන සටහන්වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශ මෙන්ම 2016 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වන වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක තොරතුරු සැකසීමේ දී හා SLFRSවලට මාරු වීමේ දිනය වන 2011 ජනවාරි 1වන දිනට SLFRS ප්‍රකාශය ආරම්භයේදී යොදා ගෙන ඇත.

SLFRS සැකසීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය කරන ගැලපීම් පෙර දක්වා සිටින කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල සිදු කර ඇත. SLAS සිට SLFRS දක්වා මාරුවීමේ ඵලයන් සම කොටස් සැසඳුම් ප්‍රකාශයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හා ගැලපුම් සටහන්වල දක්වා ඇත.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

සඳහා සටහන් | **2016** | **2015**

6 **ආදායම**

	2016	2015
තේ අලෙවිය	95,469,667	525,348,607
දේශීය තේ අලෙවිය	2,870,003	28,146,840
කසල තේ අලෙවිය	1,727,187	5,426,424
පොහොර අලෙවිය	573,000	14,872,520
අමු ද්‍රව්‍ය සෘජු අලෙවිය	-	2,356
පොහොර අලෙවි වට්ටම්	-	(277,485)
	100,639,857	**573,519,262**

7 **වෙනත් ආදායම්**

	2016	2015
රජයේ ප්‍රදාන - පුනරාවර්තන	150,000,000	-
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ - යටිනුවර බැරකම් ලියා හැරීම්	-	350,024
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ - හිනිදුම බැරකම් ලියා හැරීම්	-	816,713
තේ ක්ෂේත්‍ර ආදායම	1,777,570	10,188,324
ප්‍ර/කා ගාස්තු (කර්මාන්තශාලා)	-	31,169,380
විවිධ ආදායම්	563,429	1,320,400
	152,340,999	**43,844,841**

8 **ශුද්ධ මූල්‍ය පිරිවැය**

	2016	2015
පොලී ආදායම		
ස්ථාවර තැන්පතු පොලිය	**588,508**	**394,909**
පොලී වියදම්		
බැංකු ණය පොලිය / තැරැව්කරුවන්ගේ අත්තිකාරම් සහ ණය පොළිය	**2,343,609**	**20,468,018**
ශුද්ධ මූල්‍ය පිරිවැය	**1,755,101**	**20,073,109**

9 **බදු පෙර ලාභය**

පහත සඳහන් දෑ ඇතුළුව සියළු වියදම් අය කිරීමෙන් පසුව

බදු පෙර ලාභය සැකසේ.

විගණකවරුන්ගේ පාරිශ්‍රමික

ක්ෂය වීම්

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් පිරිවැය - විශ්‍රාම පාරිතෝෂිතය

කාර්ය මණ්ඩල පිරිවැය

10 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ 2006 අප්‍රේල් 1 දින සිට වසර පහක කාලයක්

දක්වා අරමුදල බදු වලින් නිදහස් කර ඇති අතර එම නිදහස් කිරීම 2011 වසරේ දි අවසන්විය. මේ වනවිට අරමුදල බදු බැරකම් තත්ත්වය දේශීය ආදායම් පනතට අනුව තක්සේරු කරමින් සිටි. එහි ප්‍රතිඵලයක් ලෙස නිදහස් කළ කාල සීමාව

සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් සිදු කර නොමැත.

11 **කොටසක මූලික ඉපයීම / (අලාභය) (රු.)**

ලවය ලෙස භාවිත කළ මුදල

	2016	2015
සාමාන්‍ය කොටස් හිමියන්ට ලැබිය යුතු ශුද්ධ ලාභය (රු.)	(30,529,438)	(39,232,292)
හරය ලෙස භාවිත කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		
නිකුත් කරන ලද සාමාන්‍ය බර තැබූ කොටස් ප්‍රමාණය (සංඛ්‍යාව)	20,601,415	20,601,415
කොටසක මූලික ඉපයීම / (අලාභය) (රු.)	(1.48)	(1.90)

සාමාන්‍ය කොටස් හිමියන්ට වාර්තාකරණ කාලය තුලදී අත්විය යුතු ලාභය නිකුත් කරන ලද සාමාන්‍ය බර තැබූ කොටස්

ප්‍රමාණයෙන් බෙදීමෙන් කොටසක මූලික ඉපයීම් ගණනය කෙරේ

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

12 දේපල, පිරියත හා උපකරණ

	සින්නක්කර වත්කම්							බදු වත්කම්		
පිරිවැය හෝ ඇගයීම	ඉඩම් හා ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රසූත්‍ර	මෝටර් රථ	ලීබඩු සහ සවිකුරු	පරිගණක	උපකරණ හා මෙවලම්	දුරකතන	ඉඩම් හා ගොඩනැගිලි	ලීබඩු සහ සවිකුරු	එකතුව
2016.01.01 දිනට ශේෂය	215,359,552	271,642,350	25,373,359	4,453,204	4,565,247	3,347,357	330,200	-	-	525,071,269
අඩු කළා: ක්ෂයවීම්										
2016.01.01 දිනට ශේෂය	36,442,844	171,205,523	24,420,859	3,889,369	2,481,616	2,716,641	306,635	-	-	241,463,487
වසරේ අයකිරීම්	4,472,918	7,733,636	95,250	56,384	208,363	63,072.00	2,357.00	-	-	12,631,980
	40,915,762	178,939,159	24,516,109	3,945,753	2,689,979	2,779,713	308,992	-	-	254,095,467
2016.12.31 දිනට ශේෂය	174,443,790	92,703,191	857,250	507,451	1,875,268	567,644	21,208	-	-	270,975,802

ශුද්ධ ධාරණ අගයන්	**2016**	**2015**
සින්නක්කර වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි	174,443,790	178,916,709
පිරියත හා යන්ත්‍රසූත්‍ර	92,703,191	100,436,827
මෝටර් රථ	857,250	952,500
ලීබඩු සහ සවිකුරු	507,451	563,835
පරිගණක	1,875,268	2,083,631
උපකරණ හා මෙවලම්	567,644	630,716
දූරකථන	21,208	23,565
	270,975,802	283,607,783
කෙරීගෙන යන නොනිමි වැඩ	1,567,205	1,653,830
	272,543,007	**285,261,613**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

සඳහා සටහන්	2016	2015

12 1 නොනිමි ප්‍රාග්ධන කාර්යයන් (ගොඩනැගිලි/ පිරියත සහ යන්ත්‍රසූත්‍ර)

ජනවාරි 01 දිනට ශේෂය	1,653,830	5,641,342
පෙර වර්ෂවල ගැලපුම්	(86,625)	-
ආයෝජන දේපල වෙත මාරුකිරීම	-	(3,987,512)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,567,205**	**1,653,830**

13 අස්පෘශ්‍ය වත්කම් – පරිගණක මෘදුකාංග

ජනවාරි 01 දිනට ශේෂය	2,600,000	2,435,000
එකතු කිරීම් / (අපහරණයන්)	-	165,000
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,600,000**	**2,600,000**

14 ආයෝජන දේපල

පිරිවැය

ඉඩම් සහ ගොඩනැගිලි

ජනවාරි 01 දිනට ශේෂය	16,692,535	12,225,000
එකතු කිරීම්	-	827,055
සින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	-	(13,052,255)
සින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	-	16,692,535
දෙසැම්බර් 31 දිනට ශේෂය	**16,692,535**	**16,692,535**

පිරියත / යන්ත්‍රසූත්‍ර සහ වෙනත්

ජනවාරි 01 දිනට ශේෂය	56,320,698	17,274,250
එකතු කිරීම්	-	3,509,850
සින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	-	(20,784,100)
සින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	-	56,320,698
දෙසැම්බර් 31 දිනට ශේෂය	**56,320,698**	**56,320,698**

ක්ෂය කිරීම්

ජනවාරි 01 දිනට ශේෂය	43,567,160	13,484,614
එකතු කිරීම්	-	574,260
සින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	-	(14,058,874)
සින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	-	38,922,833
වසරේ අයකිරීම්	1,724,462	4,644,327
	45,291,622	**43,567,160**

ශුද්ධ ධාරණ අගය

ඉඩම් හා ගොඩනැගිලි	12,333,089	12,773,785
පිරියත / යන්ත්‍රසූත්‍ර සහ වෙනත්	15,388,522	16,672,288
කෙරීගෙන යන නොනිමි වැඩ	3,987,512	3,987,512
	31,709,123	**33,433,585**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

සඳහා සටහන්	**2016**	**2015**

15 **පරිනත / අපරිනත වගා**

පරිනත වගාව (තේ)

පිරිවැය

ජනවාරි 01 දිනට ශේෂය	10,002,019	7,319,420
එකතු කිරීම්/ (අපහරණ)	-	2,682,599
දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,002,019**	**10,002,019**

ක්‍රමක්ෂය

ජනවාරි 01 දිනට ශේෂය	2,560,323	1,699,813
වසරේ අයකිරීම්	225,483	860,510
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,785,806**	**2,560,323**
ශුද්ධ පොත් වටිනාකම	**7,216,213**	**7,441,696**

අපරිනත වගාව (තේ)

පිරිවැය

ජනවාරි 01 දිනට ශේෂය	6,716,358	7,808,301
එකතු කිරීම්	-	1,590,656
මාරු කිරීම්	-	(2,682,599)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,716,358**	**6,716,358**
මුළු ශුද්ධ පොත් වටිනාකම	**13,932,571**	**14,158,054**

16 **මූල්‍ය උපකරණ**

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්ග

මූල්‍ය තත්වය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය වත්කම් හා බැරකම් වල ධාරණ අගය පහත දැක්වේ.

මූල්‍ය වත්කම්	සටහන		
ණය සහ ලැබිය යුතුදෑ			
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	18	271,543,470	282,511,012
මුදල් හා මුදල්වලට සමාන දෑ	20	44,134,539	3,181,092
මුළු මූල්‍ය වත්කම්		**315,678,009**	**285,692,104**

ණය හා ලැබීමට නියමිත දෑ ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට ආසන්න බැවින් ඒවායේ ධාරණ අගයට දක්වා ඇත.

මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම්

ණයගැනීම්	6,008,533	6,008,533
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	335,801,261	309,758,086
බැංකු අයිරා	448,909	13,049,148
මුළු මූල්‍ය බැරකම්	**342,258,703**	**328,815,767**

වෙනත් මූල්‍ය බැරකම් ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට ආසන්න වන බැවින් ඒවායේ ධාරණ අගයට දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

සඳහා සටහන් | **2016** | **2015**

17 භාණ්ඩ තොග

	2016	2015
කර්මාන්තශාලා තේ තොග	3,439,789	25,743,830
ගබඩා/ තැරැව්කරුවන් වෙතැති තේ තොග	-	36,483,610
අමුද්‍රව්‍ය	-	1,020,555
නිමි භාණ්ඩ	-	101,257
දේශීය තේ අලෙවි අංශයේ ඇති තේ තොග	-	1,132,852
සාමාන්‍ය තොග	-	4,885,369
ලිපිද්‍රව්‍ය - කර්මාන්තශාලා	-	27,136
පොහොර තොග - කර්මාන්තශාලා	948,133	195,984
	4,387,922	**69,590,593**

18 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

	සටහන	2016	2015
වෙළඳ ලැබිය යුතු දෑ	18.1	119,848,226	119,848,226
තැන්පතු හා අත්තිකාරම්	18.2	41,018,320	40,372,471
වෙනත් ලැබිය යුතු දෑ	18.3	110,676,924	110,676,924
		271,543,470	**270,897,621**

18 1 වෙළඳ ලැබිය යුතු දෑ

	2016	2015
වෙළඳ ලැබිය යුතු දෑ	131,461,617	131,461,617
හානි පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්	(11,613,391)	(11,613,391)
	119,848,226	**119,848,226**

18 2 තැන්පතු හා අත්තිකාරම්

	2016	2015
තැන්පතු	1,269,372	1,269,372
ගෙවූ අත්තිකාරම්	39,748,948	39,103,099
	41,018,320	**40,372,471**

18 3 වෙනත් ලැබිය යුතු දෑ

	2016	2015
ලැබිය යුතු පොලිය	61,143,439	61,143,439
වෙනත්	57,274,525	57,274,525
	118,417,964	118,417,964
හානි පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්	(7,741,040)	(7,741,040)
	110,676,924	**110,676,924**

19 ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ

	2016	2015
ආර්ථික සේවා ගාස්තු (ESC)	**2,790,822**	**2,790,822**

20 මුදල් හා මුදල්වලට සමාන දෑ

	2016	2015
වාසිදායක ශේෂ		
අතැති මුදල්	-	36,936
බැංකුගත මුදල්	44,134,539	3,144,156
	44,134,539	3,181,092
අවාසිදායක ශේෂ		
බැංකු අයිරා	(448,909)	(13,049,148)
මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා වන මුදල් හා මුදල් වලට සමාන දෑ	**43,685,630**	**(9,868,056)**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

		2016	**2015**
21	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත්කළ හා සම්පූර්ණයෙන්ම ගෙවූ සාමාන්‍ය කොටස් 20,601,415	**206,014,150**	**206,014,150**
	ප්‍රත්‍යාගණන සංචිත	**50,249,773**	**50,249,773**
	රඳවාගත් ඉපැයුම් (හරට)		
	ජනවාරි 01 දිනට ශේෂය	(367,912,464)	(328,680,172)
	කෙරීගෙන යන නොනිමි වැඩ සඳහා ගැලපුම්	(86,625)	-
	වසරේ ලාභය/(අලාභය)	(30,529,438)	(39,232,292)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**(398,528,527)**	**(367,912,464)**
22	**සාමාජිකයන්ගේ දායකත්ව අරමුදල**		
	ජනවාරි 01 දිනට ශේෂය	135,221,950	135,184,750
	වර්ෂය තුළ ලැබීම්	21,900	37,200
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**135,243,850**	**135,221,950**
23	**රජයේ ප්‍රදාන**		
	ජනවාරි 01 දිනට ශේෂය	262,503,018	331,803,521
	වර්ෂය තුළ ලැබීම්	-	**50,000,000**
	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	43,750,503	(119,300,503)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**218,752,515**	**262,503,018**
24	**සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම**	48,833,264	50,000,000
	බැරකම් ක්‍රමක්ෂය කිරීම	-	(1,166,736)
		48,833,264	**48,833,264**
25	**ණය ගැනීම්**		
	ජංගම නොවන කොටස		
	කාලීන ණය 25.1	-	18,381,397
	ජංගම කොටස	-	
	කාලීන ණය 25.1	-	(12,372,864)
		-	**6,008,533**

ස්ථාවර හා චල අනුපාත මත ප්‍රකාශිත ණය ගැනීම්වල ධාරණ අගයන් පහත දක්වා ඇත.

චල අනුපාතිකය		
කාලීන ණය හා කෙටිකාලීන ණය ගැනීම්වල ධාරණ අගයන්	-	-
ස්ථාවර අනුපාතිකය		
කාලීන ණය හා කෙටිකාලීන ණය ගැනීම්වල ධාරණ අගයන්	**-**	**-**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

සඳහා සටහන්	**2016**	**2015**

25 1 කාලීන ණය

ජනවාරි 01 දිනට ශේෂය	6,008,533	18,381,397
ණය ලබාගත්/(ආපසු ගෙවීම්)	(6,008,533)	(12,372,864)
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**6,008,533**
ජංගම කොටස	-	(12,372,864)
ජංගම නොවන කොටස	-	18,381,397
	-	**6,008,533**

26 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

ජනවාරි 01 දිනට ශේෂය	28,521,886	26,431,383
විස්තීරණ ආදායමෙහි හඳුනාගත් වියදම්	32,335,941	5,791,088
වර්ෂය තුළ සිදුකළ ගෙවීම්	(1,722,551)	(3,700,585)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**59,135,276**	**28,521,886**

26 1 විස්තීරණ ආදායමෙහි හඳුනාගත් වියදම්

ප්‍රවර්තන සේවා පිරිවැය	-	3,474,653
වසරේ පොලී අයකිරීම	-	2,026,881
ගිණුම්කරණ උපකල්පන වෙනස්වීමෙන් හටගත් ලාභ/ (අලාභ)	-	289,554
	-	**5,791,088**

අරමුදල මගින් සිදු කළ මෙම උපකල්පන, විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සඳහා යොදනු ලබන විචල්‍යයන් පිළිබඳ කළමනාකරණයේ හොඳම ඇස්තමේන්තු මත පදනම් වේ. වට්ටම් අනුපාතිකය දිගු කාලීන රාජ්‍ය ඇපකර වල වෙළඳපල අනුපාත පදනම මත තීරණය කෙරේ.

යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දැක්වේ.

වට්ටම් අනුපාතිකය	-	10.75%
ඉදිරි වැටුප් වැඩිවීම	-	2%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	-	3%
විශ්‍රාම වයස (අවුරුදු)	55	55

27 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	**318,946,968**	**309,758,086**
28 ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		
රඳවුම් බද්ද (WHT)	**4,545,276**	**4,545,276**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	පීඑෆ්/බී/ටීඑෆ් ඒ/1/2016/09	ඔබේ අංකය / உமது இல. / Your No.		දිනය / திகதி / Date	2024 පෙබරවාරි 29 දින

ලේකම්,

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

තේ ශක්ති අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වනාවනය

තේ ශක්ති අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වනාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය ප්‍රකාශනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කම්වල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට හෝ සෑම වසර 3 ක් හෝ 5 ක් තුළ එම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවද අරමුදලේ ස්ථාවර වත්කම් 2006 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 68 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතමයක් විකුණා බැහැර කිරීමේදී ඇතිවන ලාභය හෝ අලාභය මූල්‍ය වර්ෂයේ ලාභය හෝ අලාභයට ගැලපිය යුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අරමුදල සතු ධාරණ අගය ශුන්‍ය වූ වාහන 04 ක් රු. 6,761,400 කට විකුණා තිබූ අතර එම විකිණීමෙන් ලද ලාභය, උක්ත පරිදි ගැලපීමක් නොකරව මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ ලෙස ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම එම වාහන 04 ඇතුළු වාහන 5 ක පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් හා මූල්‍ය ප්‍රකාශ සඳහා වූ උපලේඛනවලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදල සතු මෝටර් වාහන 37 ක් අරමුදලේ ස්ථාවර වත්කම් ලේඛනයට හා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ අතර 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා ක්ෂය වෙන් කර තිබුණි. එයින් වාහන 17 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් කර තිබූ අතර ඉතිරි වාහන 20 සඳහා සමාලෝචිත වර්ෂයේ දී ක්ෂය වෙන්කිරීම් රු.95,250 ක් වූ අතර ඒ අනුව වර්ෂයේ අලාභය රු.95,250 කින්ද රඳවාගත් ඉපැයුම් වල ශේෂය රු.20,346,301 කින්ද අධිතක්සේරු වී තිබුණි.

(ඈ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ ශක්ති අරමුදල මැදිහත් වීමෙන් කුඩා තේ වතු සමිති වෙත සැලකිලි ක්‍රමයට ලබාදී තිබුණු වාහන 13 ක් සඳහා කල්බදු වාරික ලෙස 2001 හා 2002 වර්ෂවලදී රු.2,691,326 ක් තේ ශක්ති අරමුදල විසින් ගෙවීම් කර තිබූ අතර එය ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටද මෙම ශේෂය අයකර ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. මෙම ලැබීම අවිනිශ්චිතව පැවතියද ඒ සඳහා ප්‍රතිපාදනයක් සිදු කිරීමටද අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු බත්තරමුල්ල පැලවත්තෙහි පිහිටි ඉඩමක් මිලදී ගැනීමට 2010 මාර්තු 31 දින රු.8,082,256 ක අත්තිකාරම් මුදලක් අධිකාරිය වෙත ගෙවා තිබුණද එම ඉඩමේ සම්පූර්ණ වටිනාකම නොගෙවීම

හේතුවෙන් අධිකාරිය විසින් 2016 ජූලි 07 දින රු.7,000,000 ක් සෙත් ශක්ති අරමුදල වෙත ආපසු ගෙවා තිබුණි. එසේ වුවද, අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු නොකර ආපසු ලැබුන රු.7,000,000 ක මුදල අවිනිශ්චිත ගිණුමට බැර කර ගෙවූ රු.8,082,256 ක් ලැබිය යුතු අත්තිකාරම් ලෙස වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් අරමුදලේ වත්කම් හා වගකීම් රු.7,000,000 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඉ) පස්පර සෙත් ශක්ති කම්හලේ වියදම් පියවා ගැනීම සඳහා ලබා ගෙන තිබුණු රු.2,000,000 ක බැංකු අයිරාව, මූල්‍ය ප්‍රකාශනය තුළ නිවැරදිව වර්ගීකරණය නොකර ජංගම වගකීම් යටතේ වූ කප්පම් හා පොළිය ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී ගෙවන ලද 2016 වර්ෂයේ මාස 6 කට අදාළ රක්ෂණ වාරික වටිනාකම වූ රු.5,993,437 ක් 2016 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසානයට ද අනෙකුත් ලැබිය යුතු දෑ තුළ දක්වා තිබීමෙන් අරමුදලේ වත්කම් හා හිඟකම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී තිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශ අනුව 2015 දෙසැම්බර් 31 දිනට සෙත් ශක්ති කර්මාන්තශාලා 15 ක කාර්ය මණ්ඩලය හා ලේක් හෝල් සමාගමට ගෙවා තිබුණු උත්සව අත්තිකාරම් හා වෙනත් අත්තිකාරම් වල (වසර 7කට වඩා පැරණි) ශේෂය රු.903,912 ක් වූ නමුත් අත්තිකාරම් ලේඛනයේ පිළිතුරු අනුව එම අගය රු.264,733 ක් පමණක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෙම ශේෂය හා ලැබිය යුතු ශේෂය හා පිළිතුරු අනුව ලබාදෙන ලද ශේෂය අතර වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) සෙත් ශක්ති අරමුදලේ යටිනුවර, පොකුපිටිය හා මුල්ගම්පොළුපිටිය කම්හල් ඉදිකිරීමට අදාළව ආයතනයක් වෙත 2001 වර්ෂයේදී රු.28,311,751 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට අත්තිකාරම් ලබා දී වර්ෂ 15 කට වැඩි කාලයක් ගත වී තිබුණද අත්තිකාරම නිරවුල් කර ගැනීමට හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන හඳුනාගැනීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ කැන්පතු හා අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්තශාලා 4ක තිබූ සෙත් තොග වටිනාකම රු.7,902,517 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. එම තිබූ සෙත් තොග සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලාභ අලාභ ගිණුමේ හානි ලෙස හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඩ) 2008 වර්ෂයේ සිදුව තිබූ රු.1,548,354 ක මූල්‍යමය පාඩුවක් වගකිව යුතු පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වර්ෂ 08ක කාලයක සිට අවිකලද හා වෙනත් ලැබිය යුතු ද ශේෂ ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඪ) විගණනය සඳහා සාක්ෂි නොවීම

	විෂයය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොකළ සාක්ෂි
	....	....	....
(i)	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	92,703,191	භාණ්ඩ සමීක්ෂණ වාර්තා
(ii)	නිමි ඇඳුම් සහ ගබඩා තොග	4,387,922	තොග සමීක්ෂණ වාර්තා
(iii)	අවිකලද හා වෙනත් ලැබිය යුතු ශේෂ	271,543,470	ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ
(iv)	අවිකලද හා වෙනත් ගෙවිය යුතු ශේෂ	318,946,968	එම

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් සහ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ හෙළිදරව් සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ

නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී ගනුදෙනුම නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම සහ අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතවාරණය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2 **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය වාරණය සඳහා පදනම් කොටසේ "අ" දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව

අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 396	නිකුත් කරන ලද දෙවිමට ඉදිරිපත් නොකළ චෙක්පත් වල වලංගු කාලය වන මාස 06 ඉක්මවූ චෙක්පත් වලංගු කර නැවත ආදායමට බැර කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට වසර 8 සිට වසර 26 දක්වා කල් ඉකුත් වූ බැංකුවට ඉදිරිපත් නොකළ රු.213,500 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධව යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 06 වන අතර 2023 දෙසැම්බර් 18 වන විටත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	2015 සැප්තැම්බර් 23 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2015 චක්‍රලේඛයේ 02 වන ඡේදය	අක්‍රිය තීර බැංකු ගිණුම් වැසීමේදී චක්‍රලේඛයේ ආකෘති පත්‍ර අංක TOD /BA /03 නිවැරදිව සම්පූර්ණ කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම කළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අක්‍රීයව පැවති බැංකු ගිණුම් 03 ක් වැසීමට කටයුතු කර තිබූ නමුත් අරමුදල විසින් නියමිත ආකෘති පත්‍ර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කාර්යයන් සහ අරමුණුවලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඡ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනය කර ගැනීම කර නොමැති බව.

(අ) හොරණ පොහොර ගබඩාව සහ කුළුපිටිය,හිනිදුම්,රයිගම කෝරළය හා පස්යර යන කම්හල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අරමුදල විසින් රු.81,036,209 ක් වැයකර තිබුණද එම ගොඩනැගිලි පිහිටි භූමිවල අයිතිය අරමුදල සතුව නොපැවතුණි.

(ආ) 2016 ජූලි 13 දිනැති අංක අමප 16/1224/726/015-I සහ 2016 නොවැම්බර් 17 දිනැති අංක අමප/16/1427/726/015-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් මේ ශක්ති අරමුදලේ කටයුතු වැඩිදි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ගැනියාය, ගිලීමලේ, රයිගම් කෝරළේ සහ දූරණියගල යන මේ කර්මාන්තශාලා බදු පදනමට තෙවන පාර්ශවයන්ට ලබා දී තිබුණි. එම වලංගු තිබුණු බදු ගිවිසුම්වල 07 වන වගන්තියේ සඳහන් පරිදි ඉල්ලා බදු ලබාගත් පාර්ශවයන් විසින් මාසික අනු ලදු ධාරිතාවට සරිලන වටිනාකම් ප්‍රමාණයට මෙම ශක්ති අරමුදල නාමින් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගත යුතු නමුත් අරමුදල ඒ අනුව බදුකරුවන්ගෙන් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි.

(ඇ) තවද, එළඹ තිබුණු බදු ගිවිසුමේ දෙවන ඡේදය ප්‍රකාරව රයිගම් කෝරළේ මෙම ශක්ති කම්හල බදු ගැණුම්කාර පක්ෂය වන දීක්ෂගත කුඩා තේ වතු සංවර්ධන සමිතියෙන් ආපසු ගෙවන තැන්පත් මුදලක් වශයෙන් මාස 06 ක බදු කුලිය වන රු.1,500,000 ක මුදල, මෙම ශක්ති අරමුදල වෙත අයකරගත යුතු නමුත් 2021 වර්ෂයේදී බදු ගිවිසුම අවසන් වන විටද අරමුදල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 ජූලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාල මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අංක 04 ප්‍රකාරව, පොළිය සමඟින් නැවත ප්‍රතිලාභ ලබා දීම හා සුභසාධන රක්ෂණ අරමුදලින් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු. මිලියන 135 ක මුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අනුව කම්හල් බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටසක් අරමුදල වෙත ලබාදීම සිදුකළ යුතු වුවද සුභසාධන අරමුදල වෙත එම මුදල් බැර කිරීම මේ දක්වා සිදුකර නොතිබුණි.

(ඉ) අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කාමරවල ජනෙල්වලට ආවරණ සැකසීම සඳහා වටිනාකම රු.2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිසිලෙස සැකසීමේ කටයුතු සඳහා එම මෘදුකාංගය භාවිතා කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට තෙත් ශක්ති අරමුදල විසින් විදුලි සම්බන්ධතාවය නැවත ලබාගැනීමේ ගාස්තු, සේවක භාරකාර අරමුදල සඳහා අධිභාර ගාස්තු සහ සේවක නඩු සඳහා දඩ මුදල් ලෙස පිළිවෙලින් රු.154,392 ක්, රු.109,342 ක් හා රු.80,500 ක් ලෙස එකතුව රු.344,234 ක් අනාර්ථිකව වියදම් කර තිබුණි.

(උ) අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස ලබාදෙන ලද 2016 ජූලි 13 දිනැති අංක අමප /16 /1224 /726 /015 - I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ප්‍රධාන කාර්යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අධ්‍යක්ෂණය පිණිස වෙනත් ආයතනවල පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම සහ පුරප්පාඩු නොපවතිනම් එකී සේවක සඳහාම මත බඳවා වෙන විශේෂ වන සේ එම ආයතන සඳහා අනුයුක්ත කළ යුතු වුවද, රාජ්‍ය ආයතන 06 ක් වෙත අනුයුක්ත කර තිබුණු තෙත් ශක්ති සේවකයන් 17 දෙනෙකු වෙනුවෙන් වැටුප් වශයෙන් රු. 6,936,224 ක මුදලක් අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පසුවද අරමුදල විසින් ගෙවා තිබුණි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා කන්තෝරු ප්‍රකාශනයේ රු.2,957,414 ක හිඟව පැවති ණය ශේෂයක් පැවතියද, එම ණයගැතියන් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) තෙත් ශක්ති අරමුදලට එරෙහිව සේවකයින් හා බාහිර පාර්ශවයන් විසින් කම්කරු විනිශ්චය සභා නඩු 142 ක්ද ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් නඩුවක් ද පවරනු ලැබ තිබුණු අතර මේ තෙත් ශක්ති අරමුදල විසින් දිසා අධිකරණවල නඩු 14 ක් ගොනුකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති